kcg.edu

Kyoto Computer Gakuin

京都コンピュータ学院

URL: https://www.kcg.ac.jp/
විද්‍යුත්තැපෑල : admissions@kcg.edu

**විමසීම්: ඇතුළත් කිරීමේ අංශය,**
**කියෝතෝ කොම්පියුටර් ගකුයින්**

10-5 නිෂිකුජෝ, තෙරනොමාඑ-චෝ, මිනාමි-කු,
කියොතෝ-ෂි, කියෝතෝ 601-8407
දුරකථනය: 075-681-6334 (+81-75-681-6334 ජපානයෙන් පිටත)
ෆැක්ස්: 075-671-1382 (+81-75-671-1382 ජපානයෙන් පිටත)

ජපානය තුළ フリーコール 0120-829-628

シンハラ語 202508

The University of Informatics™

# kcg.edu

KCG: Kyoto Computer Gakuin අධ්‍යාපන වැඩසටහන්

ජපානයේ ප්‍රථම පරිගණක අධ්‍යාපන ආයතනය 京都コンピュータ学院

## කියෝතෝ කොම්පියුටර් ගකුයින්



1963 දී පිහිටුවන ලදී 1969 දී පූර්ණ දින විෂය මාලාවක් ගොඩනඟන ලදී.

## ජපානයේ ප්‍රථම පරිගණක අධ්‍යාපන ආයතනය වන්නේ ක්‍යෝතෝ ගුකුයින් (KCG) ය.

- පරිගණක තාක්ෂණය සහ එහි න්‍යායන් පිළිබඳ ශාස්ත්‍රීය අංශයන් අවධාරණය කරන උසස් ප්‍රමිතියෙන් යුත් අධ්‍යාපනයක් ලබා දිම
- පරිගණක තාක්ෂණයේ දියුණුවට සමඟම ගමන් කරන අධ්‍යාපනයක් ලබාදීම
- පරිගණක තාක්ෂණය පිළිබඳ නිර්මාණාත්මක හැකියාවන් පෝෂණය කිරීම
- තොරතුරු-අභිමුඛ සමාජය පිළිබඳ පුළුල් මතයන් ස්ථාපනය කිරීම
- බුද්ධිය සහ සංවේදීතාව යන අංශ දෙකම වර්ධනය කිරීම

# ක්‍රමවේද සහ ප්‍රතිඵල



නිර්මාතෘ සහ සභාපති
### යොසුකෝ හසෙගාවා
Yasuko Hasegawa

භෞතික විද්‍යාව හා තාරකා විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය, විද්‍යා පීඨය, කියෝතෝ විශ්වවිද්‍යාලය (පළමු කාන්තාව)
විද්‍යා පාඨමාලාව පිළිබඳ ආචාර්ය උපාධි සම්පූර්ණ කරමින්, ක්‍යෝතෝ විශ්වවිද්‍යාලයේ
තාරකා භෞතික විද්‍යා පර්යේෂණ සඳහා පරිගණකය භාවිතා කළ ප්‍රථමයා
බාහිර විද්‍යාඥයා, පෙන්සිල්වේනියා ප්‍රාන්ත විශ්වවිද්‍යාලය, එක්සත් ජනපදය තායිලන්තය, ඝානාව, ශ්‍රී ලංකාව, පේරු සහ තවත් රටවල අධ්‍යාප අමාත්‍යාංශ සහ එවැනි ආයතනවලින් පිරිනැමෙන ලදි.
2006 වර්ෂෝ අන්තර්ජාතික විදුලි සංදේශ සංගමය වෙතින් අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ විශේෂ ත්‍යාගය පිරිනැමෙන ලදී
2011 වර්ෂයේ දී ජපන් තොරතුරු දත්ත සැකසීමේ සංගමයේ සහතිකය

කියෝතෝ කොම්පියුටර් ගකුයින් (KCG) 1963 දී ආරම්භ කරන ලද අතර එය ජපානයේ පළමු පරිගණක පුහුණු ආයතනය බවට පත් විය. එතැන් සිට, KCG සෑම යුගයකම ප්‍රගමන අවධියේ ඉතා විශිෂ්ට භූමිකාවක් ඉටු කොට තිබේ.

## කියෝතෝ කොම්පියුටර් ගකුයින් හි පුරෝගාමී ජීවගුණය

කියෝතෝ කොම්පියුටර් ගකුයින් (KCG) 1963 වසරේ ජපානයේ පරිගණක යුගය උදාවේ දී, නව යුගයක් නිර්මාණය කිරීමේ දැඩි අභිලාශයෙන් යුතුව ආරම්භ කරන ලද්දකි. ජපානයේ පළමු පරිගණක අධ්‍යාපනය වෙනුවෙන් කැප වූ ආයතනය ලෙස, KCG පිහිටුවන ලද්දේ කියෝතෝ විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යාව හා තාරකා විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාසලේ (දැන් අංශය) පිරිසක් විසිනි. එම අවධියේ ජපානයේ විශ්වවිද්‍යාලවල තොරතුරු විද්‍යා පාඨමාලා එතරම් ප්‍රසිද්ධව නොතිබුණි. නව පාසලේ මෙහෙවර වූයේ “යුගයේ අවශ්‍යතා සපුරාලීම සඳහා නිර්මාණශීලීත්වයෙන් පිරුණු තොරතුරු සැකසුම් ඉංජිනේරුවන් නිර්මාණය කිරීම යි”.

1970 ගණන්වල සිට 1980 ගණන්වල මුල් භාගය දක්වා KCG විසින් එකළ තිබූ ප්‍රමුඛ හා නවීන පන්නයේ මධ්‍යම ප්‍රමාණයේ සහ මහා පරිමාණ පරිගණක පෙළක් හඳුන්වා දෙන ලද අතර, පුහුණු වීමේ අරමුණු උදෙසා ඒවා සිසුන්ට නොමිලේ භාවිතා කළ හැකි විය. එම අවධියේ පුහුණු කටයුතු සඳහා සිසුන්ට මෙවැනි පරිමාණයකින් පරිගණක බලයක් ලබා දීම සැබවින්ම කිසිදු පාසලක සිදු නොවූ දෙයක් වූ අතර, මෙම ප්‍රතිපත්තිය අනෙකුත් විශ්වවිද්‍යාලවලට ඊර්ෂ්‍යාව දනවන කාරණයක් බවට පත්විය. පාසැල් ගොඩනැගිල්ල ප්‍රමාණයෙන් බැරැක්ක කිහිපයකට වඩා විශාල නොවුව ද, එයින් සෑම යුගයකම හැකි උසස්ම අධ්‍යාපනික වටපිටාවක් සිසුන්ට ලබා දීම පිළිබඳ වූ අධ්‍යාපනික චින්තනයේ විශ්වාසය සුරකින බව KCG විදහා දැක්වීය. අද වන විට KCG තම පදනමේ පුරෝගාමී ජීවගුණය අඛණ්ඩව පවත්වා ගෙන යයි. 2004 දී, පාසල විසින් තොරතුරු තාක්ෂණ සඳහාම කැප වූ ජපානයේ පළමු පශ්චාත් උපාධි පාසල වනකියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය (KCGI) විවෘත කරන ලදී.

අද වන විට, KCG උපාධිධාරීන් 50,000 කට වඩා බිහි කර තිබේ. KCG තුළ පුහුණු කළ පුරෝගාමී ජීව ගුණයෙන් පිරිපුන් මෙම උපාධිධාරීන් ලොව පුරා නැවුම් අභියෝග සමග නිරතුරුවම පොරබදමින් සිටී. KCG වසර 60කට වැඩි සම්ප්‍රදායක් සහ ප්‍රතිඵල පිළිබඳ එහි අභිමානය ගැන ආඩම්බර වෙයි. දැන් අනාගතය ගොඩනැගීමේ කාර්යය ඔබ වෙත පැවරේ.



කියෝතෝ එකිමඑ සරසවියේ විදුහල්පති
කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලයේ සභාපති
### යොයිචි ටෙරෂිටා
Yoichi Terashita

කියෝතෝ විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයෙන් උපාධිය ලබා ඇත. Fulbright විද්‍යාර්ථයෙකු ලෙස එක්සත් ජනපදයේ අධ්‍යාපනය ලැබී ය. භෞතික තාරකා විද්‍යාව විශේෂ උපාධිය ලෙස හදාරමින්, අයෝවා විශ්ව විද්‍යාලයෙන් විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති සහ දර්ශන ආචාර්ය උපාධි ලබා ඇත. අයෝවා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකි. පෙන්සිල්වේනියා ප්‍රාන්ත විශ්වවිද්‍යාලයෙහි පර්යේෂකයෙකු ලෙස නිරතුරුව තනතුරු හොබවා ඇත. කනසාවා තාක්ෂණ ආයතනයේ සම්මාන මහාචාර්ය. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) සමග කටයුතු කළ, තොරතුරු විද්‍යාව පිළිබඳ හිටපු තාවකාලික විශේෂඥයෙකි. KCG හි රකුහෝකු සරසවියේ හිටපු විදුහල්පති. දැනට දත්ත සමුදා ක්ෂේත්‍රයේ පාඨමාලා පිළිබඳ වගකීම දරමින් ඊට සමගාමීව KCGI හි උප විදුහල්පති ලෙස කටයුතු කරයි.

KCG යනු තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය සම්බන්ධ පුළුල් අධ්‍යාපන ආයතනයකි. අප විසින් පිරිනමන තොරතුරු තාක්ෂණ විෂය මාලාව මගින්, තොරතුරු තාක්‍ෂණයේ න්‍යායාත්මක දැනුමේ සිට ව්‍යවහාරික භාවිතය දක්වාත්, දෘඪාංගවල සිට මෘදුකාංග දක්වාත්, තොරතුරු තාක්‍ෂණය හුදෙක්ම තාක්‍ෂණයක සිට සංස්කෘතියක් දක්වාත් වශයෙන් සමාජයට අවශ්‍ය සෑම තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයක්ම ආවරණය කරයි. මෙම විෂය මාලාව හැකි උපරිම ඵලදායි බවින් ක්‍රියාවට නැංවීම සඳහා, අපගේ පීඨය නවීනතම ප්‍රායෝගික පුහුණු උපකරණවලින් සන්නද්ධ අති දක්ෂ තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්ගෙන් සමන්විත වේ.

මෙම පාසලේ දී ඔබේ සිහින සැබෑ වනු ඇතැයි මම ප්‍රාර්ථනා කරමි.



කමෝගාවා සරසවියේ විදුහල්පති
### ෂොසො නයිතො
Shozo Naito

කියෝතෝ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු උපාධිය. ගණිත ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් සමග කියෝතෝ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කර ඇත. ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය. Nippon Telegraph and Telephone Corporation (NTT) හි තොරතුරු බෙදාහැරීම් වේදිකා පර්යේෂණාගාරයේ හිටපු ප්‍රධාන පර්යේෂණ නිලධාරී. ජපානයේ ඉලෙක්ට්‍රොනික විද්‍යා, තොරතුරු සහ සන්නිවේදනය පිළිබඳ ඉංජිනේරු ආයතනයේ (IEICE) අන්තර්ජාල පර්යේෂණ කමිටුවේ හිටපු ලේකම්. කොරියානු තොරතුරු ආරක්ෂණ නියෝජිත ආයතනයේ (KISA) හිටපු උපදේශක සහ මහාචාර්ය. KCGI හි මහාචාර්යවරයෙකි.

තොරතුරු තාක්‍ෂණය අඛණ්ඩව වැඩිදියුණු වනු ඇති බවටත්, සමාජය තුළ තොරතුරු තාක්ෂණ විශේෂඥයින්ගේ (ඉංජිනේරුවන්ගේ) අවශ්‍යතාව වේගයෙන් ඉහළ යනු ඇති බවටත් මට කිසිදු සැකයක් නොමැත. නිරතුරුවම ශීඝ්‍රයෙන් නව තාක්ෂණයන් ගවේෂණය සිදු වන තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය තුළ, කෙනෙකුගේ දැනුම යාවත්කාලීනව තබා ගැනීම ඉතා වැදගත් වේ. මේ හේතුව නිසා ඉගෙනීමට බලවත් උනන්දුවක් දක්වන පුද්ගලයින්ට පවතින්නේ ඉහළ ඉල්ලුමකි.

KCG තුළ ඔබ ගෙවන් සිසු දිවිය හා ඔබේ අධ්‍යයන කටයුතු තුළින් ඔබට නව යුගයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය ශක්තිය ලැබෙනු ඇතැයි මා සිතමි. පීඨය වශයෙන් අපි ඔබේ ප්‍රයත්නයන්ට සහය වන අතර, එබැවින් ඔබේ අධ්‍යයන කටයුතු හැකි උපරිමයෙන් සිදු කරන ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිමි.



රකුහෝකු සරසවියේ විදුහල්පති
### හොං සෙඔන්ග් කෝ
Hong Seung Ko

දකුණු කොරියාවේ ඩොංගුක් විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු උපාධිය. කියෝතෝ විශ්ව විද්‍යාලයෙන් (සංඛ්‍යාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය සමග), ඉංජිනේරු විද්‍යාව පිළිබඳ දර්ශන ආචාර්ය උපාධිය නිම කර ඇත. දකුණු කොරියාවේ Samsung Electronics Co., Ltd. හි තොරතුරු උපායමාර්ග අංශයේ උපායමාර්ගික සැලසුම් කාර්යාලයේ හිටපු CIO. Harmony Navigation Co., Ltd. හ් හිටපු සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී. KISA හි හිටපු උපදේශක සහ මහාචාර්ය. Nippon ව්‍යවහාරික තොරතුරු විද්‍යා සංගමයේ (NAIS) සභාපති. දකුණු කොරියාවේ CALS/EC සංගමයේ විශේෂ කමිටු සාමාජික. ජෙජු විශේෂ ස්වයං පාලන මණ්ඩලයේ හිටපු උපදේශක. ජෙජු බුද්ධිමය දේපල ප්‍රවර්ධන උපදේශක කමිටු සාමාජික. කොරියානු EC පර්යේෂණ සංගමයේ පළමු යාවජීව සාමාජික. KCGI හි මහාචාර්යවරයෙකි.

KCG යනු සමාජයේ සෑම ක්ෂේත්‍රයකටම අවශ්‍ය තොරතුරු තාක්ෂණය අධ්‍යයනය සඳහා වූ සංසදයකි. සිසුන්ට තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ශක්තිමත් අඩිතාලමක් දැමීමට අපි අපේ සම්පූර්ණ ශක්තිය යොදවන්නෙමු. නමුත් ඊට වඩා, තාක්‍ෂණය සම්බන්ධ දත්ත විද්‍යාව සහ විවිධ ව්‍යාපාරික වටපිටාවන් තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකි දක්ෂ පුද්ගලයින් නිර්මාණය කිරීමට අපි උත්සාහ කරන්නෙමු.

තව ද, දත්ත විද්‍යාව, කෘත්‍රිම බුද්ධිය සහ සිව්වන කාර්මික විප්ලවය ආදී වේගයෙන් විකසනය වන ක්ෂේත්‍ර හා සම්බන්ධ සමාගම්වල තිරසාර වර්ධනයට අත්‍යවශ්‍ය වන පුද්ගලයින් සංවර්ධනය කිරීමට සක්‍රීයව දායක වීම KCG හි අධිෂ්ඨානය යි.

# KCG හි ප්‍රධාන ලක්ෂණ



අපේ උපාධිධාරීන් අපගේ ප්‍රමුඛ නිමැවුමයි! දෙපාර්තමේන්තු පහකින් පිරිනමනු ලබන පාඨමාලා 20ක් හරහා ඔබට ඔබ කැමති විෂයයන් සිතැඟි පරිදි ගැඹුරින් අධ්‍යයනය කිරීමේ හැකියාව ඇත.

රටවල් ගණනාවකින් පැමිණෙන විදෙස් සිසුන් රාශියක් KCG හි ඉගෙනුම ලබයි!



- ජපානයේ පරිගණක ඉගෙනුම් වෙනුවෙන්ම ආරම්භ කරන ලද පළමු ආයතනය.
- උපාධිධාරීන් 50,000කට අධික සංඛ්‍යාවක් සිටින දශක හයකට වැඩි ඉතිහාසයක්.
- දෙපාර්තමේන්තු පහකින් පිරිනමනු ලබන පාඨමාලා 20ක් හරහා ඔබට ඕනෑම තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයක් හැදෑරීමේ හැකියාව ඇත.



- ජපානයේ පුරාණ අගනුවර සහ විද්‍යාර්ථයින්ගේ නගරයක් වන කියෝතෝ හි අධ්‍යාපනය ලැබීම විශිෂ්ට අත්දැකීමකි.
- අති නවීන ඉගෙනුම් උපකරණ විශිෂ්ට ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කරයි.



- පුළුල් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය මගින් ලොව පුරා සිටිඅන් බොහෝ සිසුන් සාදරයෙන් පිළිගනී.
- ලොව පුරා අධ්‍යාපන ආයතන 100කට අධික සංඛ්‍යාවක් සමග හවුල්කාරිත්වය.



- විදේශීය සිසුන් සඳහාම වෙන් වූ පාඨමාලා මගින් ජපන් භාෂාව ඉගෙන ගැනීමට අවස්ථාව ලබා දෙයි.
- විදේශීය සිසුන් සඳහා උපකාරක පන්ති සහ අනෙකුත් කටයුතු සඳහා වන වියදම් නිදහස් කිරීමට සහ අඩු කිරීම සඳහා වූ පුළුල් පරාසයක වැඩසටහන්.



- කැපවූ සහායක කාර්ය මණ්ඩලය විදේශීය සිසුන්ගේ අධ්‍යයන හා දෛනික ජීවිතය පහසු කරයි.
- KCG නවාතැන් පහසුකම් සපයා දෙයි.



- KCG සඳහාම අනන්‍ය පුළුල් පරාසයක ශිෂ්‍යාධාර වැඩසටහන්.
- පූර්ණ කාලසටහනක් කාලසටහනක් සිදු කෙරන හුවමාරු සිසු හමු සහ අවිධිමත් සිසු හමු හරහා හුවමාරු සිසුන්ට එකිනෙකා දැන හඳුනා ගත හැක.



- නොබිඳිය හැකි වාර්තාවක් සහිතව, රැකියා සොයා ගැනීම සඳහා ලබාදෙන පුළුල් සහය.
- බොහෝ විදේශීය සිසුන් තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය හැදෑරීමට අපගේ සහෝදර ආයතනය වන KCGI වෙත උසස් වේ.



- ආයතනයට ඇතුළු වීමට පෙර ජපන් භාෂාව ඉගෙනීමට උනන්දුවක් දක්වන සිසුන්ට ඒ සඳහා අපගේ සහෝදර ආයතනය වන කියෝතෝ ජපන් භාෂා පුහුණු මධ්‍යස්ථානයහා සම්බන්ධ විය හැක.



# KCG තුළ අධ්‍යාපනය

KCG හි ඉගෙනීමෙන් ඔබ වෙත වෙනත් පාසල්වලින් ලබා ගත නොහැකි අද්විතීය විශේෂාංග පිරිනමනු ලැබේ. ගුරුවරයාගෙන් ශිෂ්‍යයාට දැනුම හුවමාරු කෙරෙන ඒක-දිශානතික සාම්ප්‍රදායික රටාව අනුගමනය කිරීම වෙනුවට, KCG සෑම සිසුවෙකුගේම පුද්ගලත්වයට ගරු කරමින් කටයුතු කරන අතරම, තම අධ්‍යාපනික ක්‍රමවේද අඛණ්ඩ පරීක්ෂාවට සහ වෙනස්කම්වලට බඳුන් කිරීම සහ අති නවීන අධ්‍යාපන පහසුකම් සැපයීම හරහා පුද්ගල ඉල්ලීම්වලට විස්තරාත්මකව ප්‍රතිචාර දක්වයි. KCG අභිලාෂකාමී සිසුන්ට තම සිහින උපරිම තලයට හඹා යාමට සහය දක්වයි.

## ◆ විශිෂ්ට චරිත සංවර්ධනයක් ලබාදෙන ප්‍රායෝගික විෂය මාලාවක්

**සෑම ක්ෂේත්‍රයකම ප්‍රමුඛයින් විසින් මෙහෙයවනු ලබන සැබෑ ලෝකය හා සෘජුවම සම්බන්ධ වූ පාඩම් සැබෑ දක්ෂයින් බිහි කරයි.**

### ■ අනාගතයේ දී ක්‍රියාකාරී භූමිකාවන් ඉටු කළ හැකි පුද්ගලයින්

සමාජයේ ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කිරීමට නම් හුදෙක් ශිල්පීය ක්‍රමවලට සහ දැනුම් සමුදායකට එහා ගිය යමක් අවශ්‍ය වේ. ඉගෙනගත් දෑ ඵලදායීව හසුරුවමින් සැබෑ ලෝකයේ පවතින අවශ්‍යතාවන් උදෙසා ප්‍රායෝගිකව යොදා ගැනීමට සැබෑ දක්ෂතාවක් අවශ්‍ය වේ. KCG තුළ, අපි උපාධිධාරීන්ට තම අනාගත වෘත්තීන් සඳහා අවශ්‍ය මූලාරම්භය ලබා දෙමින් කාර්මික ලෝකයේ අවශ්‍යතා පිළිබිඹු කරන ස්ථානීය විෂය මාලාවක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන්නෙමු.

අපගේ කථිකාචාර්යවරුන් ප්‍රධාන ඉලෙක්ට්‍රොනික උපකරණ නිෂ්පාදකයින් සහ ක්‍රීඩා-මෘදුකාංග ආයතන ඇතුළුව ප්‍රායෝගික ආයතනික අත්දැකීම් සහිත ප්‍රමුඛ පෙළේ වෘත්තිකයන් වේ. මෙම සැබෑ ලෝකයේ අත්දැකීම මත පදනම්ව, මෙම උපදේශකයින් වත්මන් ව්‍යාපාරික ලෝකයේ අවශ්‍යතා සඳහාම නිමවූ ප්‍රායෝගික අධ්‍යාපනයක් ලබා දෙයි. බොහෝ කථිකාචාර්යවරුන් තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් සංවර්ධනය සඳහාම කැපවූ ජපානයේ පළමු වෘත්තීය පශ්චාත් උපාධි පාසල වන KCGI පීඨයේ සාමාජිකයින් ද වේ.

### ■ ඔබේම ඉලක්ක සහ සිහිනවලට ඔබින පරිදි අධ්‍යයන කටයුතු සිදු කිරීම

KCG හිදී අපි ඔබේ අවශ්‍යතාවලට අනුකූලව පාඨමාලා නිවැරදිව තෝරා ගත හැකි පොහොසත් විෂය මාලාවක් සහිත වරණ ක්‍රමයක් අනුගමනය කරමු. මෙමගින් ඔබට ඔබේම ලැදියාවන්ට සහ අත්දැකීම්වලට ඔබින පරිදි අධ්‍යයන කටයුතු කරගෙන යා හැක. ඔබට ඔබේ බුද්ධිමය විමර්ෂණ විෂය පථය පුළුල් කර ගනිමින්, විවිධ පීඨවල සහ දෙපාර්තමේන්තුවල පාඨමාලා ඇතුළුව ඔබට උපාධිය සම්පූර්ණ කිරීමට අවශ්‍ය වන ඒකකවලට වඩා වැඩි පාඨමාලා ගණනක් හැදෑරීම ද කළ හැකි ය.



විෂයමාලාව මගින් මූලික කරුණුවල පටන් උසස් තාක්ෂණික ක්‍රම සහ දැනුම දක්වා ක්‍රමානුකූලව ඔබව මෙහෙයවන බැවින් පරිගණකයට ආධුනික සිසුන්ට පවා විශ්වාසයෙන් යුතුව ඉගෙනුම් කටයුතු කළ හැක.

## ◆ ව්‍යාපෘති අධ්‍යයනය තුළින් ඉසව් ගණනාවක හැකියාවන් වර්ධනය කර ගන්න

**සම්මන්ත්‍රණ ක්‍රමවේදය මගින් ඔබේ තාක්ෂණික කුසලතා මෙන්ම රැකියා සොයාගැනීමට අවශ්‍ය කුසලතා සමගාමීව වැඩිදියුණු කරවයි.**

සම්මන්ත්‍රණ ක්‍රමවේදය තුළ, සිසුන් එක් එක් පාසල් වර්ෂය තුළ ව්‍යාපෘති අධ්‍යයන කටයුතු සිදු කරයි. මේ ආකාරයෙන්, එක් එක් පාඨමාලාවේ දී ලබා ගත යුතු කුසලතා සහ දැනුම එකිනෙකට සමගාමීව ශක්තිමත් කරනුයේ, පහසුවෙන් භාවිතා කළ හැකි සහ ප්‍රායෝගිකව ක්‍රියාවෙහි යෙදවිය හැකි සම්පූර්ණ හා මනාව ගැලපෙන කුසලතා ගොන්නක් වැඩිදියුණු කරමිනි. හුදෙක්ම ගැටලුවක් අධ්‍යයනය කිරීමට වඩා, සිසුන් කණ්ඩායම් වශයෙන් වැඩ කරමින්, ඉලක්ක සැකසීම, සැලසුම් කිරීම, නිර්මාණය කිරීම, පිරිසැකසුම් කිරීම සහ අවසාන වශයෙන් අභිලාෂයන් තෘප්තිමත් කරන සහ උසස් තත්ත්වයේ නිර්මාණ සිදු කිරීම හා ඉදිරිපත් කිරීම සිදු කරයි.

වත්මන් ව්‍යාපාරික ලෝකයේ තාක්ෂණික හැකියාව ඉතා වැදගත් නමුත් එය පමණක්ම ප්‍රමාණවත් නොවේ. නූතන වෘත්තිකයන්ට කණ්ඩායම් වැඩ කිරීමේ කුසලතා, නායකත්වය, අන්තර් පුද්ගල සන්නිවේදනය, කාල කළමනාකරණය සහ ඉදිරිපත් කිරීම යනාදී කුසලතා අත්‍යවශ්‍ය වේ. කණ්ඩායම් වැඩ පිළිබඳ නිරතුරු අත්දැකීම් ලබා දීමෙන්, සිසුන්ට මෙම කුසලතා ගොන්න ස්වභාවිකවම ලබා ගැනීමට හැකියාව ව්‍යාපෘති අධ්‍යයනයන් මගින් ලැබේ. ව්‍යාපෘති සඳහා සකසා ඇති තේමාවල දුෂ්කර බව එක් පාසල් වසරක සිට අනෙක් පාසල් වසර දක්වා වැඩි වන අතර, එය මූලික ක්‍රියාකාරකම්වලින් ඇරඹී ඉතා සංකීර්ණ ක්‍රියාකාරකම් දක්වා ගමන් කරන්නේ ඔබ උපාධිය ලබා ගන්නා අවස්ථාව වන විට ඔබ ලබාගෙන ඇති ප්‍රායෝගික හැකියාවල පෘථුල බව සහ ගැඹුර ඔබටම වටහාගත හැකි පරිද්දෙනි. ඔබ උපාධිය ලබා ගන්නා වර්ෂයේ ව්‍යාපෘති අධ්‍යයනය මගින්, ඔබ එතෙක් ඉගෙනගත් දේවල්වල අග්‍ර ඵලය වශයෙන් ඔබේ උපාධි නිබන්ධනය සකස් කිරීම සිදු වේ.

සෑම පෙබරවාරි මසකම පවත්වනු ලබන ශිෂ්‍ය ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ KCG සම්මාන ප්‍රදානෝත්සවය මගින් ව්‍යාපෘති අධ්‍යයනයේ දී නිර්මාණය කරන ලද විශිෂ්ට ව්‍යාපෘති නිවේදනය කිරීම හා ඇගයීම සිදු වේ.









## ◆ සිසුන්ගේ ඉගෙනුම් අභිලාෂයන් තෘප්තිමත් කිරීම සඳහා පූර්ණ-පරිපූර්ණ ඉ-ඉගෙනුම්

### ස්ථානය සහ වේලාව අනුව සීමා නොවී ඔබේම වේගයකින් අධ්‍යයනය කරන්න

**■ අති නවීන ඉ-ඉගෙනුම් මැදිරිය**

කියෝතෝ එකිමඑ සරසවි උප පරිශ්‍රය නවතම උපකරණවලින් සමන්විත ඉ-ඉගෙනුම් විකාශන මැදිරියකින් යුක්ත වන අතර, එයට සජීවී අන්තර්ගතයන් සඳහා වූ දුරස්ථ දේශන පද්ධතියක් සහ පූර්ව පටිගත කළ අන්තර්ගතයන් සඳහා දේශන පටිගත කිරීමේ පද්ධතියක් ඇතුළත් වේ. මෙම ඉ-ඉගෙනුම් මැදිරිය මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කරමින්, KCG මගින් ගුරු කාර්ය මණ්ඩලයට විශිෂ්ට විකාශන ගුණාත්මයෙන් යුත් නවතම ඉ-ඉගෙනුම් අන්තර්ගතයන් නිර්මාණය කර බෙදා හැරීමට හැකියාව ලබා දේ. මෙම පද්ධතිය සිසුන්ට විවිධ ඉගෙනුම් අවස්ථා සඳහා ප්‍රවේශය සහතික කරයි.

**■ අති නවීන ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් වන KING-LMS හරහා පැය 24 පුරා සහය**

වත්මන් ලෝකයේ අන්තර්ජාල ප්‍රවේශයේ බහුලත්වයත් සමග, ලොව පුරා තොරතුරු වෙත ක්ෂණිකව ප්‍රවේශ වීම සුළු කොට තකන තරම් ඉතා පහසු කටයුත්තකි. මෙම වැඩිදියුණු වීම කල්තියාම අපේක්ෂා කළ KCG ජපානයේ සුවිශේෂී ඉගෙනුම් කළමනාකරණ පද්ධතියක් (LMS) ක්‍රියාත්මක කළ පළමු අධ්‍යාපන ආයතනවලින් එකකි.

මෙම පද්ධතිය භාවිතා කරමින්, සිසුන්ට ඕනෑම වේලාවක ඕනෑම තැනක සිට පරිගණකයක් හෝ ස්මාර්ට් ජංගම දුරකතනයක් මගින් තමා කැමති අන්තර්ගතයක් සිතැඟි පරිදි සහ පහසුවෙන් අධ්‍යයනය කිරීමේහැකියාව ඇත.









## ◆ පුළුල් රැකියා සෙවුම් ආධාරක පද්ධතියක්

### ද්විත්ව-උපදේශන පද්ධතියක් සහ තොරතුරු තාක්ෂණය හරහා පරිපූර්ණ සහාය ලබා ගැනීම

**■ තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩල හිඟයක් අතරතුර ස්ථාවර බඳවා ගැනීමේ ප්‍රතිඵල**

KCG ස්ථාවර බඳවා ගැනීමේ ප්‍රතිඵල ලබා දෙයි. මෙයට හේතුව බොහෝ කලක සිට ජපානයේ පවතින තොරතුරු තාක්ෂණ සේවකයින්ගේ, විශේෂයෙන්ම උසස් තොරතුරු තාක්ෂණ සේවකයින්ගේ හිඟයට අමතරව, KCG සිසුන් සමාජයේ වත්මන් අවශ්‍යතාවලට මනාව ගැලපෙන අති නවීන කුසලතා ඉගෙනීමෙන් ඔවුන්ට ලැබෙන ප්‍රතිලාභය යි. කොවිඩ් වසංගතයෙන් ඇති කරන ලද දරුණු වෙනස්කම් මධ්‍යයේ, තොරතුරු තාක්ෂණය යොදා ගැනීම හරහා වේගයෙන් ව්‍යාප්ත වන දුරස්ථ කාර්යකරණය සහ මාර්ගගතව පවත්වන ඉසව් ආදී ක්ෂේත්‍ර පරාසයක පිබිදීමක් ඇති වී තිබේ. KCG උපාධිධාරීන් යනු වත්මන් ව්‍යාපාර අවශ්‍යතාවලට හොඳින්ම සරිලන පිරිසකි.

**■ පුළුල් පරාසයක කර්මාන්ත සහ ක්ෂේත්‍රවල ක්‍රියාකාරී තනතුරු**

අද වනවිට තොරතුරු තාක්ෂණයෙන් තොර ව්‍යාපාරයක් ගැන සිතා ගැනීමට පවා නොහැකි තරම් ය. පරිගණක ක්ෂේත්‍රයේ පමණක් නොව සෑම ව්‍යාපාරික ක්ෂේත්‍රයකම පරිගණක පිළිබඳ දැනුම අත්‍යවශ්‍ය අංගයක් බවට පත්ව තිබේ. නිෂ්පාදන කටයුතු, සිල්ලර වෙළඳාම, මූල්‍ය කටයුතු, ඉදිකිරීම් සහ මාධ්‍ය වැනි විවිධ ක්ෂේත්‍රවලට අදාළ සමාගම්වල පරිගණක ආශ්‍රිත කුසලතා සහ දැනුම ඇති පුද්ගලයින්ට නිරන්තර ඉල්ලුමක් පවතී. KCG උපාධිධාරීන්ට ක්‍රියාකාරී භූමිකාවන් ඉටු කළ හැකි ක්ෂේත්‍ර ඇත්තෙන්ම ඉතා අධික ය.

**■ වෙළඳපොළ ගැන සාවධානයෙන් සිටින පුද්ගල මාර්ගෝපදේශය සුදුසුම රැකියා සෙවුම් අත්දැකීමක් ලබා දෙයි**

සිසුන්ට සහ උපාධිධාරීන්ට සෑහීමකට පත්විය හැකි රැකියා සෙවීමේ අත්දැකීමක් ලබා ගැනීම සඳහා නිවැරදි උපදේශකයින් අවශ්‍ය වේ. එම ඉදිරි දර්ශනය සිත තබාගෙන, KCG පන්ති උපදේශකයින් සහ වෘත්තීය මධ්‍යස්ථාන උපදේශකයින් සමීප සම්බන්ධීකරණයෙන් කටයුතු කරනුයේ, එක් එක් ශිෂ්‍යයා සතු ගුණාංග තක්සේරු කරමින් ඔවුන් හට අත්‍යවශ්‍ය රැකියා සෙවුම් උපදෙස් ලබා දී සහාය වෙමිනි. පලමු වසරේ සිටම නිරතුරු සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලබන්නේ සෑම සිසුවෙකුටම වෘත්තීය ගමන් මගක් තෝරා ගැනීම, අධ්‍යයන ඉලක්ක සහ තවත් බොහෝ දේ පිළිබඳ සැලකිලිමත් මඟපෙන්වීමක් ලබා දෙමිනි. ඕනෑම අවස්ථාවක වෘත්තීය උපදෙස් ලබා දීමට වෘත්තීය මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය කැපවී සිටියි. KCG හි රැකියා සෙවීමේ සහ වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන්හි කැපී පෙනෙන ලක්ෂණය වන්නේ එක් එක් පුද්ගලයාගේ සවිස්තරාත්මක අවශ්‍යතා කෙරෙහි පූර්ණ අවධානය යොමු කිරීම යි.







# KCG සම්මාන ප්‍රදානෝත්සවය

වැඩිදුර දැනගන්න

### ශිෂ්‍යයන්ගේ ව්‍යාපෘති ඉදිරිපත් කිරීම

**◆ අපේ උපාධිධාරීන් සැබවින්ම අපගේ ප්‍රමුඛ නිමැවුමයි! KCG සම්මාන ප්‍රදානෝත්සවය එය සනාථ කරයි.**

සෑම වසරකම KCG විසින් ශිෂ්‍ය ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ KCG සම්මාන ප්‍රදානෝත්සවය පවත්වනු ලබයි. මෙම වාර්ෂික උත්සවයේ දී සිසුන් තම උපාධි වර්ෂයේ ව්‍යාපෘති වන *magna opera* ඇතුළුව තම වාර්ෂික ව්‍යාපෘතිවල ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරයි. මෙම ශිෂ්‍ය ව්‍යාපෘති අතරින් වඩාත් කැපී පෙනෙන ව්‍යාපෘති තෝරාගෙන ප්‍රසිද්ධ ඉදිරිපත් කිරීමක් හරහා විශිෂ්ඨත්වය උදෙසා වන සම්මානය පිරිනමනු ලැබේ. බොහෝ ව්‍යාපෘති ඉක්මනින්ම වාණිජකරණය සඳහා සූදානම් මට්ටමේ පවතින අතර, ඒවාට ව්‍යාපාරික සහ ශාස්ත්‍රීය ලෝකයේ ප්‍රශංසා හිමි වේ.

**◆ ජාත්‍යන්තර සිසුන් ද මෙයට උද්යෝගයෙන් සහභාගී වන අතර, ඔවුන් හොඳම ව්‍යාපෘති සම්මානය සහ විශිෂ්ටත්වය උදෙසා වන සම්මානය පවා දිනා ගනී.**

සෑම වසරකම ජාත්‍යන්තර සිසුන් ශිෂ්‍ය ව්‍යාපෘති ඉදිරිපත් කිරීමේ KCG සම්මාන ප්‍රදානෝත්සවයට ඉතා උද්යෝගයෙන් සහභාගී වේ. 2019 දී චීනයේ ලියු ලැංබියාවෝ ජපන් පන්තියේ තම මිතුරෙකු සමග පරිගණක ක්‍රීඩා වැඩිදියුණුව පිළිබඳ මූලික පාඨමාලාවකට බැඳී Haptic Game: Magic Folders නම් ක්‍රීඩාව නිර්මාණය කළ අතර, එය හොඳම ව්‍යාපෘතියට හිමි සම්මානය දිනාගන්නා ලදී. 2021 දී තොරතුරු ඉංජිනේරු විද්‍යා පාඨමාලාවට බැඳුණු වියට්නාම ශිෂ්‍යයෙකු වන නුයෙන් තන් මාන් තම ජපන් පන්තියේ මිතුරෙකු සමග හවුල් වී නිර්මාණය කළ රොබෝ වැකුම් ක්ලීනරයක් සඳහා විශිෂ්ටත්ව සම්මානයෙන් පිදුම් ලැබී ය.

KCG සම්මාන ප්‍රදානෝත්සවය 2019
හොඳම ව්‍යාපෘතිය සඳහා සම්මානය

## Haptic Game: Magic Folders

පරිගණක ක්‍රීඩා නිර්මාණය පිළිබඳ හැඳින්වීම **ලියු ලැංබියාවෝ, සුබසා උවෙදා**
Lyu Langbiao Tsubasa Ueda

මෙය Twister ක්‍රීඩාවට සමාන අයුරින් ක්‍රියා කරන අතර, ආකේඩ් කන්ට්‍රෝලරයක් භාවිතා කරමින්, ක්‍රීඩකයන්ව මානසිකව සහ ශාරීරිකව එකිනෙකාට එරෙහිව තරඟ කිරීමට සැලැස්වීමට “Magic Spell Synthesis” පද්ධතියකට සම්බන්ධ කරයි.





ක්‍රීඩකයන් දෙදෙනා අතර වෙඩි තබා ගන්නා Magic Spell Synthesis නම් මෙම නව සංකල්පයේ දී, ක්‍රීඩකයින් තථ්‍ය කාලීනව එකිනෙකාට එරෙහිව මන්ත්‍ර නිපදවන්නේ එයටම අනන්‍ය වූ ක්‍රීඩා විලාශයක් භාවිතා කරමිනි. මෙයට ඇතුල්වීමට ඇති බාධක අඩු නමුත් සම්පූර්ණයෙන් වැඩිදියුණු කළ සටන් ක්‍රියාදාම ක්ෂණිකව අභියෝගාත්මක එකක් බවට පත් වේ.



## රොබෝ වැකුම් ක්ලීනරය

KCG සම්මාන ප්‍රදානෝත්සවය 2021
විශිෂ්ටතා සම්මානය

තොරතුරු ඉංජිනේරු විද්‍යාව
**නුයෙන් තන් මාන්, කරොවු අරාකි**
Nguyen Tan Manh Kaoru Araki

මෙම රොබෝ වැකුම් ක්ලීනර මගින් ස්වයංක්‍රීයව කාමර පිරිසිදු කරනු ලබයි. පිරිසිදු කිරීම ආරම්භ කිරීමට සහ නැවැත්වීමට ඉහළ පාලක පැනලය භාවිතා කරයි. Wi-Fi විශේෂාංගය භාවිතයෙන් ස්මාර්ට් ජංගම දුරකතනයකින් දුරස්ථව රොබෝව ක්‍රියාත්මක කළ හැක.

KCG සම්මාන ප්‍රදානෝත්සවය 2025
හොඳම ව්‍යාපෘතිය සඳහා සම්මානය

## AnchorRoute (ඇන්කරූට්)

පරිගණක විද්‍යාව **ඕගාවා, ඕකාමොටෝ, කිරි, සුසූහිගාෂි**
Ogawa Okamoto Kiri Suzuhigashi

අනෙකුත් මාර්ග-සෙවුම් යෙදුම් මෙන් නොව, ඇන්කරූට් ගෘහස්ථව ද භාවිතා කළ හැකිය. දිශානතිය පිළිබඳ දුර්වල හැඟීමක් ඇති අයට පවා ගමනාන්තයකට හෝ එකඟ වූ රැස්වීම් ස්ථානයකට නොවරදවාම තම මාර්ගය සොයාගත හැකිය. ස්මාර්ට් ජංගම දුරකථනයේ ඇතුළත් කර ඇති සංවේදක භාවිතයෙන් මාර්ග සකසා ඇත. නැංගුරම් ලෙස හඳුන්වන වර්ධිත-යථාර්ථ (AR) වස්තූන් මාර්ගය දිගේ ජනනය වන අතර, පරිශීලකයා කැමරා දර්ශන යන්ත්‍රය හරහා ඒවා අනුගමනය කරමින් ඉලක්කයට නොවරදවාම ළඟා වේ. යෙදුම iOS සහ Android යන දෙකටම ලබා ගත හැකිය.



KCG සම්මාන ප්‍රදානෝත්සවය 2025
විශිෂ්ටතා සම්මානය

## DANTALION

ඩිජිටල් ක්‍රීඩා සහ විනෝදාත්මක ක්‍රියා **හැට්ටෝරි, ෆූජිටා**
Hattori Fujita

DANTALION යනු ලකුණු-ප්‍රහාරක-ආකාරයේ, සිරස් අතට අනුචලනය වන වෙඩි තැබීමේ ක්‍රීඩාවකි. විස්තාරණ ඒකක අභිරුචිකරණය සහ විසන්ධි කිරීම භාවිතා කරමින්, ක්‍රීඩාව පුළුල් පරාසයක ක්‍රීඩා විලාසයන්ට ඉඩ සලසයි. ක්‍රීඩකයින් ඉහළ ලකුණු සඳහා ඉලක්ක කර ගැනීම සඳහා තමන්ගේම උපාය මාර්ග නිදහසේ සකස් කර යොදති. ක්‍රීඩාවට “උණ්ඩ නිරය” ලෙස හඳුන්වන අංග ද ඇතුළත් වන බැවින්, ක්‍රීඩකයින්ට සතුරු උණ්ඩවල අතිමහත් වොලි වලින් අඛණ්ඩව වැළකී සිටීමේ ආතතිය භුක්ති විඳිය හැකිය.



# නවතම උපකරණ

වැඩිදුර දැනගන්න



## වෙනත් පාසල් වලට සම කල නොහැකි උපාංග පරිසරයක් නවීනතම පරිගණක 700 ක්

සිසුන්ට දියුණුතම තාක්ෂණයන් නිදහසේ අධ්‍යයනය කළ හැකි පරිසරයක් නිර්මාණය කිරීම යන අපගේ ප්‍රධානම ප්‍රමුඛතාවය සපුරාලීම සඳහා KCG හි දී, අපි සෑම උත්සාහයක්ම දරන්නෙමු. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය අපට සෑම දෙයක්ම වේ. අද පවා, අපගේ පාසල වේගවත් වර්ධනයක් අත්විඳින විට, එම අධ්‍යාපන දර්ශනය කෙරෙහි අපගේ කැපවීම වෙන කවරදාටත් වඩා ස්ථිර ය.



පරිසනක ක්‍රීඩා සංවර්ධන ප්‍රායෝගික අධ්‍යයන කාමරය



ක්‍රමලේඛන (ප්‍රෝග්‍රැමින්) ප්‍රායෝගික අධ්‍යයන කාමරය



ජාල ප්‍රායෝගික අධ්‍යයන කාමරය



මැක් යෙදුම් සංවර්ධන විද්‍යාගාරය



ඩේටාබේස් (දත්තපදනම්) අධ්‍යයන කාමරය



මැක් සැලසුම් විද්‍යාගාරය



මෙකාට්‍රොනික්ස් ප්‍රායෝගික අධ්‍යයන කාමරය



CAD/ඉංජිනේරු ක්‍රමලේඛන ප්‍රායෝගික අධ්‍යයන කාමරය





විශේෂ ආවරණ සහ ඇනිමෙ විද්‍යාගාරය



විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික පරිපථ නිෂ්පාදන ප්‍රායෝගික අධ්‍යයන කාමරය



3D CG නිශ්පාදන ප්‍රායෝගික කාමරය



මෝටර් රථ පාලන ප්‍රායෝගික අධ්‍යයන අවකාශය



ඉහළ නම්‍යශීලිබවින් යුත් පන්ති



මහා ශාලාව



ඉ-ඉගෙනීම් මැදිරිය



තොරතුරු ස්ථානය



පටිගත කිරීමේ මැදිරිය



ශිෂ්‍ය විවේකාගාරය

# පරිගණක ක්‍රීඩා සහ ඇනිමෙ



## KCG පුළුල් පරාසයක පරිගණක ක්‍රීඩා සහ ඇනිමෙ ඉසව් සඳහා සහභාගී වේ!

ජපන් වීඩියෝ ක්‍රීඩා සහ ඇනිමෙ ඉහළ මට්ටමේ තාක්‍ෂණයකින් නිපදවනු ලබන අතර, ඒවා ලොව පුරා රසිකයන්ගේ ආදරය හා ප්‍රසාදය දිනාගෙන ඇත. KCG හිදී අපි ක්‍රීඩා සහ ඇනිමෙ නිෂ්පාදනය පිළිබඳ පාඨමාලා පිරිනමන්නෙමු. KCG මෙම විෂයයන් ආශ්‍රිත පුළුල් පරාසයක ඉසව්වලට උද්‍යෝගයෙන් සහභාගී වන්නේ සිසුන්ගේ කුසලතා සහ සාධන මට්ටම ඉහළ නංවමිනි. මෙහි ලැයිස්තුගත කර ඇති ඉසව් KCG සහභාගී වන බොහෝ වෙළඳ ප්‍රදර්ශන සහ තරඟාවලීන්ගෙන් ඉතා සුළු කොටසක් පමණි.

### ස්වාධීන ක්‍රීඩා සමුළුවක් වන BitSummit හි කළමනාකරණය සඳහා වාර්ෂික සහභාගීත්වය




ජපානයේ විශාලතම ස්වාධීන ක්‍රීඩා සමුළුවක් වන BitSummit හිදී නවතම ක්‍රීඩා ප්‍රදර්ශනය කිරීම සඳහා කර්මාන්තයේ ප්‍රමුඛ පෙළේ ක්‍රීඩා නිර්මාණකරුවන් ජපානය පුරා සහ ලොව පුරා සිට එක්රැස් වූහ. KCG මෙම අවස්ථාව කළමනාකරණය කිරීමට සහභාගී වූ අතර, එහි සාර්ථකත්වයට දායක වූයේ ශිෂ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින් 130 කට අධික සංඛ්‍යාවකි. උත්සව කාර්ය මණ්ඩලය ලෙස සේවය කරන සිසුන්ට මෙතරම් සහභාගිවන්නන් සිටින සමුළුවක අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සන්නිවේදනය සහ ගැටළු විසඳීමේ කුසලතා පිළිබඳ අවබෝධයක් ලැබුණි. KCG සෑම වසරකම සිසුන්ගේ කෘති ප්‍රදර්ශනය කරයි. Famitsu.com සහ අනෙකුත් ක්‍රීඩා මාධ්‍ය පුළුල් ආවරණයක් සපයන බැවින්, මෙම උත්සවය කර්මාන්තය විසින් බෙහෙවින් සලකනු ලැබේ.

### කොයෝතෝ පොප් සංස්කෘතිය ලෝකය සමග බෙදා ගැනීමට KYOMAF හට අනුග්‍රහය දැක්වීම




KCG සමූහය සෑම සිසිර සෘතුවකදී ම කියෝතෝ නුවර පැවැත්වෙන කියෝතෝ ජාත්‍යන්තර මාංගා ඇනිමෙ සල්පිලට (KYOMAF) අනුග්‍රහය දක්වන්නේ සාඩම්බරයෙනි. මෙම ඉසව්ව සිදුවන අතරතුර, KCG කියෝතෝවල සිට පොප් සංස්කෘතිය ලෝකයට ව්‍යාප්ත කිරීමට මහත් පරිශ්‍රමයක් දරයි. සෑම වසරකම, ජපානය පුරා සිටින දහස් ගණන් මාංගා සහ ඇනිමෙ රසිකයින් KYOMAF වෙත ඇදී එන්නේ, සමහර KCG කුටිවල ඉතා දිගු පෝලිම් නිර්මාණය කරමිනි. COVID-19 වසංගතය අතරතුර, වෘත්තීය සජීවිකරණ ශිල්පීන් අන්තර්ජාලය හරහා ඩිජිටල් කලා ආදර්ශන විකාශනය කළ අතර ඇනිමෙ නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය පැහැදිලි කරමින් සජීවී දේශන ඉදිරිපත් කරන ලදී.

### Unity Dojo Kyoto Special හි ඉහළ මට්ටමේ සහභාගීත්වය




Unity පරිගණක ක්‍රීඩා එන්ජිම Fate/Grand Order, Pokémon GO සහ Super Mario Run වැනි ජනප්‍රිය ක්‍රීඩා නිර්මාණය කිරීමේ දී භාවිතා වේ. Unity කෙරෙහි අවධානය යොමු කරන මහා පරිමාණ අධ්‍යයන සැසියක් වන Unity Dojo Kyoto Special සිසුන් සිය ගණනක් සහභාගීත්වයෙන් KCG විසින් කියෝතෝ එක්මළු සරසවියෙහි පවත්වන ලදී. අනුග්‍රාහකයා වූ Cloud Creative Studios, Inc., යනු KCG හි උපාධිධාරීන් අධික සංඛ්‍යාවක් සේවයට අනුයුක්ත කරගන්නා ක්‍රීඩා සංවර්ධකයෙක් වන අතර, මෙම වසරේ උත්සවයේ බොහෝ මෙහෙයවන්නන් සහ VR ක්‍රීඩා අත්දැකීම් කුටි සහායකයින් වූයේ KCG හි උපාධිධාරීන් ය.




වැඩිදුර දැනගන්න

Kyocotan යනු KCG හි මංගල සංකේත වස්තුවයි. මෙම මංගල සංකේතය KCG සිසුන් සහ ගුරුවරුන් මෙන්ම වෘත්තීය නිර්මාණකරුවන් විසින් පුළුල් පරාසයක මෝස්තර සහ ආකෘතිවලින් නිර්මාණය කර ඇත.
KYOMAF ඇතුළු විවිධ ඉසව්වල දී ඔබට Kyocotan දැකගත හැකි ය.



# KCG පරිගණක කෞතුකාගාරය

ජපානයේ තොරතුරු පිරිසැකසුම් සමාජය විසින් ඓතිහාසික පරිගණක පිළිබඳ
පළමු චන්ද්‍රිකා කෞතුකාගාරය ලෙස සහතික කරන ලදි

### KCG පරිගණක කෞතුකාගාරය පිළිබඳව

1963 දී, ටෝකියෝ විශ්ව විද්‍යාලයේ සිසු පර්යේෂකයින් IBM 709/7090 සඳහා පරිගණක අධ්‍යයන කණ්ඩායමක් පිහිටුවන ලද අතර වැඩමුලු පවත්වන ලදි. එය ජපානයේ කිසිදු විශ්ව විද්‍යාලයක තොරතුරු පද්ධති දෙපාර්තමේන්තුව පිහිටුවා නොතිබූ කාලය වේ.

එතැන් පටන්, ජපානයේ පළමු පුද්ගලික පරිගණක අධ්‍යාපන ආයතනය වන, කියෝතෝ කොම්පියුටර් ගකුයින්විශේෂ උපාධිධාරීන් බිහිකළ අතර ඔවුන් ජපානය තුළ තොරතුරු කර්මාන්තයේ පදනම ගොඩ නගන ලදී.

අපි අපගේ සංස්කෘතිමය වශයෙන් වටිනා පරිගණක හඳුන්වාදීමට කැමති වන අතර, ඒවා අපගේ පරිගණක අධ්‍යාපනය සඳහා භාවිතා කරන ලදී. 2012 දී NEAC පද්ධතිය 100 සහ 2013 දී MZ-80K වැනි අපගේ පාසලේ උපකරණ තොරතුරු පිරිසැකසුම් තාක්ෂණික උරුමය ලෙස ක්‍රමානුකූලව හඳුනා ගනු ලැබ ඇත.

KCG පරිගණක කෞතුකාගාරය ජපානය තුළ පළමු සහ එකම "ඓතිහාසික පරිගණක පිළිබද පළමු චන්ද්‍රිකා කෞතුකාගාරය" ලෙස සහතික කරන ලදී.



තොරතුරු පිරිසැකසුම් තාක්ෂණික උරුමය TOSBAC-3400 (2009 මාර්තු 2 බලය දෙන ලදී)



තොරතුරු පිරිසැකසුම් තාක්ෂණික උරුමය OKITAC-4300 පද්ධතිය (2009 මාර්තු 2 බලය දෙන ලදී)



තොරතුරු පිරිසැකසුම් තාක්ෂණික උරුමය NEAC-2206 (2011 මාර්තු 2 බලය දෙන ලදී)



තොරතුරු පිරිසැකසුම් තාක්ෂණික උරුමය NEAC System 100 (2012 මාර්තු 6 බලය දෙන ලදී)



තොරතුරු පිරිසැකසුම් තාක්ෂණික උරුමය MZ-80K (2013 මාර්තු 6 බලය දෙන ලදී)



තොරතුරු පිරිසැකසුම් තාක්ෂණික උරුමය PDP 8 /I (2015 මාර්තු 17 බලය දෙන ලදී)



තොරතුරු පිරිසැකසුම් තාක්ෂණික උරුමය TOSBAC-1100D (2016 මාර්තු 10 බලය දෙන ලදී)




භෞතික හා රසායනික පර්යේෂණ ආයතනය (Riken), Fujitsu Limited K පරිගණකය

## ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරවල වෘත්තිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන දේශන



### නියෝජිත අධ්‍යක්ෂ
### ක්‍රිප්ටන් ෆියුච මීඩියා,
### Hatsune Miku නිෂ්පාදක

කියෝතෝ තොරතුරු තාක්ෂණ උපාධි අධ්‍යයන විද්‍යාලයේ මහාචාර්ය

# හිරෝයුකි අයිතෝ

Hiroyuki Itoh

"මිරායි කරා කිතා හජිමෙතේ නො ඔතෝ" ("අනාගතයෙන් පළමු හඬ") යන ජපන් වාක්‍යයෙන් ව්‍යුත්පන්න වූ නමක් ඇති, Hatsune Miku යනු අතථ්‍ය ගායකයෙකු වන අතර පරිශීලකයෙක් භාවගීතය සහ ස්වර රචනයක් පරිගණකයට ඇතුළත් කළ විට ඔහු කෘතිම හඬකින් ගීතය ගායනා කරයි. Hatsune Miku ජපානයේ පමණක් නොව විදේශයන්හි පවා සජීව ප්‍රසංග පවත්වා ඇත්තේ රසිකයින් සමූහයක හදවත තුළ රැඳෙමිනි. මෙම සංවේදනයේ හේතුව වන Hatsune Miku කෘතිම හඬ නිර්මාණය කළ සමාගම වන ක්‍රිප්ටන් ෆියුච මීඩියා හි නියෝජිත අධ්‍යක්ෂ හිරෝයුකි අයිතෝ මහාචාර්යවරයෙක් ලෙස KCGI හා එකතු වී ඇත.

පරිගණකගත හඬවල් නිෂ්පාදනය කරන මෘදුකාංග අඛණ්ඩව සංවර්ධනය කරන මහාචාර්ය අයිතෝ අනාගතයේ තොරතුරු තාක්ෂණ කර්මාන්තය මෙහෙයවන තරුණ පරපුරට පහත සඳහන් පණිවිඩය ලබා දේ. "අපි අතරමඟ පමණක් සිටින තොරතුරු විප්ලවයේ දේශ සීමාව සීමාවක් නොමැතිව විශාල වන අතර ඔබගේ අනාගත දෘෂ්ටි කෝණ සීමාවක් නොමැතිව ඔබට පෙර විසිරී යයි. මෙම සංකල්පය දැඩිව මනසේ තබාගෙන ඔබගේ අධ්‍යයන සඳහා කැපවන මෙන් මම ඉල්ලා සිටිමි." අපි මහාචාර්ය අයිතෝ සමග සම්මුඛ සාකච්ඡාවක් සිදු කළෙමු.




KCGI හි මහාචාර්ය හිරෝයුකි අයිතෝ Vocaloid මෘදුකාංග හඬ බැංකුවක් වන Hatsune Miku හි දියුණුව ගැන සිහිපත් කරන්නේ ඉතා උද්‍යෝගයෙනි.
(ග්‍රේට් හෝල්, එකිමඑ සරසවිය, KCG)



ක්‍රිප්ටන් ෆියුච මීඩියා යනු වීඩියෝ ක්‍රීඩා හෝ ඇනිමෙ සමාගමක් නොවේ. අපි සංගීත නිර්මාණ කටයුතු සිදු කළත්, අපි සංගීතය පටිගත කිරීමේ සමාගමක්ද නොවේ. අපි පරිගණක සංගීත විනෝදාංශය ව්‍යාපාරයක් බවට පත් කළ බැවින්, මා සිතන්නේ අපි "ශබ්ද අලෙවිකරුවෙක්" ලෙස යි. Hatsune Miku 2007 අගෝස්තුවල අලෙවිය සඳහා පළමුවෙන් නිකුත් කරන ලද නමුත් ජනතාව නිර්මාණාත්මක කාර්යයක් සමග මුහු කිරීම සඳහා මෙම මෘදුකාංගය අවස්ථාවක් බවට පත් වූ බව මම විශ්වාස කරමි.

මනුෂ්‍යත්වය එහි අතීතය තුළ පරිවර්තන තුනකට මුහුණ දී ඇතිබව කියනු ලැබේ. පළමුවැන්න වූයේ කෘෂිකාර්මික විප්ලවයයි. මෙම විප්ලවය හේතු කොට ගෙන, දඩයම්කිරීම මත ඔවුන්ගේ විශ්වාසය නිසා ඔබමොබ යාමට බලකරන ලද මනුෂ්‍ය වර්ගයා ක්‍රමානුකූලව ආහාර නිෂ්පාදනය කළ අතර, ඒවා ගබඩා කිරීම කරා පැමිණියේය. මෙසේ ස්ථිර වාසස්ථානවල ජීවත්වීම ආරම්භ විය. මේ නිසා, සමාජ සහ රාජ්‍ය සකස් විය. එමෙන්ම ධනයේ විෂමතාවන් නිර්මාණය විය. ආර්ථිකයන්ගේ සංවර්ධනය යුද්ධයට හේතුවක් බවට පත් වූ බව කියනු ලැබේ.

දෙවන විප්ලවය වූයේ කාර්මික විප්ලවයයි. ක්‍රියාවෙහි යොදන බලය සොයා ගනු ලැබූ අතර එක සමාන අයිතම කාර්යක්ෂමව නිර්මාණය කිරීමට හැකිවීම වැනි නව්‍යකරණයන්ගේ වර්ධනය බහු නිෂ්පාදනයට සහ බහු පරිභෝජනයට උපත ලබාදුන්හ මෙය විශාලපරිමාණයේ ධනය ඇතිකිරීමට සහය වෙමින් වෙළෙඳාම සහ වාණිජය ඉක්මණින් ඉදිරියට ගෙන යන ලදී. මෙම විප්ලවය "ජනගහන ප්‍රසාරණය." ට හේතුවක් විය. කාර්මික විප්ලවයට පෙර ඉහළ උපත් සහ ඉහළ මරණ අනුපාතයක් සහිත යුගය තුළ, මනුෂ්‍ය ජනගහනය සැබැවින්ම ස්ථිරව තිබුනු අතර, සමාජය තුල ධනයේ උච්ඡාවචන යම් තරමකට තිබූ නමුත් කාර්මික විප්ලවය සමඟ මනුෂ්‍ය ජනගහනය වේගයෙන් වැඩිවිය.

තෙවන විප්ලවය වන්නේ අන්තර්ජාලය විසින් නියෝජනය කරන තොරතුරු තාක්ෂණයේ වටිනාකම විසින් ඇතිකළ තොරතුරු විප්ලවයයි. අන්තර්ජාලයට පෙර, තොරතුරු සම්ප්‍රේෂකයින් සීමා වූ අතර, එය ඒකාකාධිකාරි විය. තොරතුරු මුලාශ්‍රයන්ට පුවත්පත් සමාගම්, රූපවාහිණී සහ ගුවන්විදුලි මධ්‍යස්ථාන සහ ප්‍රකාශන සමාගම් වැනි මාධ්‍ය ආයතන ඇතුළත් නමුත් මෙම කණ්ඩායම් තොරතුරු බෙදා හැරීමේදී, පහසුකම් සහ මනුෂ්‍ය බලය අනුව සැලකියයුතු පිරිවැයක් ඒ සමග පවතී. තවද, මෙම කාලයේදී තොරතුරු ප්‍රමාණයෙන් අඩුවන අතර ඒකදිශාගත වේ. එසේවුවත්, අන්තර්ජාලයේ පැමිණීම තොරතුරුවල මෙම විප්ලවය ඇති කරන ලදී. තොරතුරු බෙදා හරින ආකාරය සැලකිය යුතු ලෙසින් වෙනස් කර ඇත.

දැන් අන්තර්ජාලය අතිශයින්ම සමීපව පවතී, අපේ අත්වල අල්ල මත, අපේ මේසවල, සහ අපෙ සාක්කුවලට රිංගා ඇත. ප්‍රවෘත්ති, චිත්‍රපටි සහ සංගීතය ලෙස ඩිජිටල්කරණය කළ හැකි තොරතුරු, සම්පූර්ණයෙන්ම තොරතුරු, පහසුවෙන් අන්තර්ජාලය හරහා සම්ප්රේෂණය කර ගබඩා කර තැබිය හැකිය. ජීවිතය සහ රැකියාව අතිශයින්ම පහසු, විනෝදජනක සහ සුවපහසු බවට පත් වී තිබේ; ක්ෂණිකව ඔබට ඔබේ ප්රියතම වීඩියෝ සහ විකාශන මාධ්‍යයන් කැඳවීමට සහ බැලීමට හැකිය. මීට මීට අමතරව, මෙම තොරතුරු මඟින් ඕනෑම කෙනෙකුට පහසුවෙන්ම සහ ක්ෂණිකව Facebook, X, සහ බ්ලොග් ඔස්සේ පුද්ගලික පුවත්වල ඉතා කුඩා දෙවල් ඇතුළුව ඔවුන් ගැන තොරතුරු පහසුවෙන්ම සහ ක්ෂණිකව බෙදා ගැනීමට හැකි වේ.

එසේවුවත් තොරතුරු විප්ලවය හේතු කොට ගෙන සිදුවන වෙනස්වීම්වලට පූර්විකාව අපි තවමත් අත්විඳිමින් සිටින බව මම විශ්වාස කරමි. කෘෂිකාර්මික සහ කාර්මික විප්ලව මනුෂ්‍ය වර්ගයා ජීවත් වූ ආකාරය බරපතල ලෙස වෙනස් කරන ලදී. තොරතුරු විප්ලවයෙන් ඇතිකළ වෙනස්වීම මෙතෙක් ඒ මට්ටමට පැමිණ නැත. මෙය හුදෙක් පරිවර්තනීය කාලපරිච්ඡේදයක් වන අතර සැබෑ වෙනස්වීම් ආරම්භ වීමට නියමිතය. මෙතැන් සිට වසර 20 සිට 30ක් තුල ජනතාවගේ ජීවන රටාවට සහ ලෝකය තුළ විශාල වෙනස්වීම් අපිට දැකිය හැකිවනු ඇතැයි මම විශ්වාස කරමි. එසේවුවත්, මම මෙවැනි වෙනස්වීම් කෙසේවේද? මේවා වෙනස්වන්නේ කෙසේද සහ එය අපට සහ ඉදිරි පරම්පරාව භාරගන්නා තරුණ පරපුරට එය බලපාන ආකාරය. මම නොදනිමි.





# දෙපාර්තමේන්තු **පහක්** මගින් පිරිනමනු ලබන පාඨමාලා **20ක්** සමග, ඔබේ අභිලාෂය න්මුදුන් පමුණුවා ගැනීමට ඇති හැකියාව අසීමිත වේ

### සිව් අවුරුදු වැඩසටහන හදාරන උපාධිධාරීන්ට
## උසස් තාක්ෂණික ඩිප්ලෝමාවක් හිමි වේ

නිශ්චිත කොන්දේසි සපුරාලන සහ උසස් වෘත්තීය පාසලක වසර හතරක විශේෂඥ පුහුණුවක් ලබා ඇති සිසුන්ට අධ්‍යාපන, සංස්කෘතික, ක්‍රීඩා, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යවරයා විසින් (MEXT අමාත්‍යවරයා) "උසස් තාක්ෂණික ඩිප්ලෝමාවක්" (*Kodo Senmonshi*) ප්‍රදානය කෙරේ. උසස් තාක්ෂණික ඩිප්ලෝමාවක් ඇති සිසුන් බොහෝ අවස්ථාවල විශ්වවිද්‍යාල උපාධිධාරියෙකුගේ උපාධියට සමාන හෝ ඊට වඩා වැඩි විශේෂිත ක්ෂේත්‍රයක දැනුම සහ කුසලතා යන දෙකම ඇත්තවුන් බවට සමාජයේ පිළිගැනීමක් ලැබේ. KCG හි, A, B, C, D සහ E යන දෙපාර්තමේන්තුවලින් ඔබට උසස් තාක්ෂණික ඩිප්ලෝමාවක් ලබා ගත හැකි සිව් අවුරුදු වැඩසටහනක් සඳහා වන පාඨමාලා පිරිනමනු ලැබේ. ඔබ සිව් අවුරුදු පාඨමාලාව සම්පූර්ණ කරන විට ඔබට පශ්චාත් උපාධි පාසලට ඇතුළත් වීමේ විකල්පය ලැබේ. බොහෝ KCG උපාධිධාරීන් KCG සමූහයේ ආයතනයක් වන KCGI වෙත ලියාපදිංචි වේ.

### දෙපාර්තමේන්තු පහක සිව් අවුරුදු වැඩසටහන්
## ප්‍රායෝගික වෘත්තීය විශේෂඥ වැඩසටහන්
### ලෙස සහතික කර ඇත

"විශේෂිත පාසල්වල විශේෂඥ වැඩසටහන්වල වෘත්තීය අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීමේ සහ වැඩිදියුණු කිරීමේ" අරමුණින් MEXT විසින් "ප්‍රායෝගික වෘත්තීය විශේෂඥ වැඩසටහන්" හඳුන්වා දී ඇත. මෙම ප්‍රායෝගික වෘත්තීය විශේෂඥ වැඩසටහන්, සමාගම් සහ සංවිධාන සමග හවුල්කාරිත්වයෙන් සිදු කරනු ලබන පාඨමාලා සහ අධ්‍යාපනික වැඩසටහන් වලින් සමන්විත වේ. සහතිකකරණය ලබා ගැනීම සඳහා, සිසුන් හවුල්කාර සේවා ස්ථානවල පුහුණුව ලබා කුසලතා දියුණු කරගත යුතු ය. KCG හි, දෙපාර්තමේන්තු පහක් තුළ හදාරන සිව් අවුරුදු වැඩසටහන් "ප්‍රායෝගික වෘත්තීය විශේෂඥ වැඩසටහන්" ලෙස සහතික කොට ඇත. මෙම වැඩසටහන් මගින් ප්‍රායෝගික, විශේෂීකරණය වූ අධ්‍යාපනයක් ලබා දෙනුයේ සමාගම් සහ දැනට කර්මාන්තයේ ඉදිරි පෙළේ සිටින ක්‍රියාකාරී වෘත්තිකයන් සමඟ හවුල්කාරිත්වයෙනි. KCG විසින් ඒ සමගම අනෙකුත් දෙපාර්තමේන්තු සඳහා සහතිකකරණය ලබා ගැනීමට කටයුතු සූදානම් කිරීමට සැලසුම් කරයි.






## A කලාව හා නිර්මාණය
Art & Design

ඩිජිටල් කලාකරුවන්ගේ නවතම තාක්ෂණය හා එක් වන්න


| | | |
|---|---|---|
| කලා සහ නිර්මාණ තොරතුරු විද්‍යා වැඩසටහන<br>කලා සහ නිර්මාණ තොරතුරු විද්‍යා පාඨමාලාව / මංගා සහ ඇනිමෙ පාඨමාලාව | අවුරුදු 4 | p.14 |
| උසස් කලා සහ නිර්මාණ වැඩසටහන | අවුරුදු 3 | |
| මැන්ගා සහ ඇනිමේ වැඩසටහන | අවුරුදු 3 | |
| කලා සහ නිර්මාණ වැඩසටහන<br>චිත්‍ර හා නිර්මාණ පාඨමාලාව / මංගා සහ ඇනිමෙ පාඨමාලාව | අවුරුදු 2 | |


## B ව්‍යාපාර සහ කළමනාකරණය
Business & Management

තොරතුරු තාක්ෂණය හරහා ව්‍යාපාරයේ ප්‍රමුඛස්ථානයට ළඟා වන්න


| | | |
|---|---|---|
| ව්‍යාපාර සහ කළමනාකරණ තොරතුරු විද්‍යා වැඩසටහන<br>කළමනාකරණ තොරතුරු පාඨමාලාව / දත්ත විද්‍යා පාඨමාලාව | අවුරුදු 4 | p.15 |
| ව්‍යවහාරික තොරතුරු විද්‍යා වැඩසටහන<br>වෛද්‍ය තොරතුරු විද්‍යා පාඨමාලාව / සමුද්‍ර තොරතුරු තාක්ෂණ පාඨමාලාව / කෘෂිකාර්මික තොරතුරු තාක්ෂණ පාඨමාලාව / මූල්‍ය තාක්ෂන (FinTech) පාඨමාලාව / ව්‍යාපාරික තොරතුරු තාක්ෂණ පාඨමාලාව | අවුරුදු 3 | |
| තොරතුරු ව්‍යාපාරික වැඩසටහන | අවුරුදු 2 | |
| තොරතුරු තාක්ෂණ වෛද්‍ය පරිපාලන වැඩසටහන | අවුරුදු 2 | |


## C පරිගණක විද්‍යාව
Computer Science

වර්තමාන තොරතුරු සමාජයේ ප්‍රමුඛ පෙළට සහය වීම


| | | |
|---|---|---|
| පරිගණක විද්‍යා වැඩසටහන | අවුරුදු 4 | p.16 |
| මල්ටිමීඩියා පරිගණක වැඩසටහන | අවුරුදු 3 | |
| පරිගණක ජාලකරණ වැඩසටහන | අවුරුදු 3 | |
| තොරතුරු පිරිසැකසුම් වැඩසටහන<br>තොරතුරු පිරිසැකසුම් පාඨමාලාව / තොරතුරු තාක්ෂණ හඬ නළු/ නිළි පාඨමාලාව / උපාධි අධ්‍යයන හුවමාරු වැඩසටහන | අවුරුදු 2 | |


## D ඩිජිටල් ක්‍රීඩා සහ විනෝදාත්මක ක්‍රියා
Digital Game & Amusement

උසස් මට්ටමේ පරිඝනක ක්‍රීඩා නිර්මාණකරුවෙකු ලෙස වෘත්තිය මාර්ගයක් හඹා යන්න


| | | |
|---|---|---|
| උසස් ඩිජිටල් ක්‍රීඩා සහ විනෝදාත්මක ක්‍රියා වැඩසටහන | අවුරුදු 4 | p.17 |
| උසස් ඩිජිටල් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන | අවුරුදු 3 | |
| ඩිජිටල් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන | අවුරුදු 2 | |


## E එම්බෙඩැඩ් පද්ධති සඳහා ඉංජිනේරු විද්‍යාව
Engineering for Embedded Systems

කැපී පෙනෙන පාලක ඉංජිනේරුවකු වීමට අපේක්ෂා කිරීම


| | | |
|---|---|---|
| තොරතුරු ඉංජිනේරු වැඩසටහන | අවුරුදු 4 | p.18 |
| උසස් පරිගණක ඉංජිනේරු වැඩසටහන<br>පරිගණක ඉංජිනේරු විද්‍යා පාඨමාලාව / මෝටර් රථ පාලන පාඨමාලාව | අවුරුදු 3 | |
| පරිගණක ඉංජිනේරු විද්‍යා වැඩසටහන | අවුරුදු 2 | |


## නම්‍යශීලී මාර්ගගත පාඨමාලාව
Flexible Online Course

නිවසේ සිටියදී ම ඔබේ කුසලතා ප්‍රගුණ කර ගන්න


| | | |
|---|---|---|
| ජාත්‍යන්තර ව්‍යවහාරික තොරතුරු විද්‍යා වැඩසටහන<br>▼<br>පාඨමාලා පූර්ණ කාලීන වැඩසටහන් බවට පරිවර්තනය කරගැනීම කළ හැක | අවුරුදු 4 | p.27 |


## තොරතුරු සහ සන්නිවේදනය
Information & Communication

ඔබ වැඩ කරනා අතර ඉගෙන ගන්න හෝ එකවර පාසල් දෙකකට සහභාගී වන්න


| | | |
|---|---|---|
| තොරතුරු සහ සන්නිවේදනය<br>තොරතුරු සහ සන්නිවේදන පාඨමාලාව / විශ්ව විද්‍යාල උපාධි නිපුණතා උසස් කිරීමේ පාඨමාලාව / වසරක සන්ධ්‍යා කාලීන පාඨමාලාව | අවුරුදු 1 | p.18 |
| තොරතුරු සහ සන්නිවේදන පාඨමාලාව<br>රාත්‍රී අධ්‍යයන අංශය | අවුරුදු 2 ක රාත්‍රී පාඨමාලාව | |


## ජාත්‍යන්තර සිසුන් සඳහා වැඩසටහන්

විදෙස් රටක තොරතුරු තාක්ෂණය හදාරා ලෝකය දකින්න


| | | |
|---|---|---|
| ජාත්‍යන්තර ICT ව්‍යාපාරික පාඨමාලාව | අවුරුදු 2 | p.19 |
| ජාත්‍යන්තර මෝටර් රථ පාලන පාඨමාලාව | අවුරුදු 3 | p.20 |
| ජාත්‍යන්තර ව්‍යාපාරික තොරතුරු තාක්ෂණ පාඨමාලාව | අවුරුදු 2 | p.20 |
| ගෝලීය සංචාරක තොරතුරු පාඨමාලාව | අවුරුදු 2 | p.21 |
| ජාත්‍යන්තර මංගා සහ සජීවිකරණ තාක්ෂණ පාඨමාලාව | අවුරුදු 3 | p.21 |
| ජාත්‍යන්තර ව්‍යාපාර කළමනාකරණ පාඨමාලාව | අවුරුදු 3 | p.22 |
| ජාත්‍යන්තර තොරතුරු විද්‍යා පාඨමාලාව | අවුරුදු 4 | p.22 |
| ජාත්‍යන්තර කලා තොරතුරු පාඨමාලාව | අවුරුදු 4 | p.23 |
| ජාත්‍යන්තර කළමනාකරණ තොරතුරු විද්‍යා පාඨමාලාව | අවුරුදු 4 | p.23 |
| ජාත්‍යන්තර තොරතුරු පාඨමාලාව | අවුරුදු 3 | p.24 |
| ජාත්‍යන්තර කලා හා නිර්මාණ පාඨමාලාව | අවුරුදු 3 | p.24 |
| ගෝලීය සංචාරක උසස් තොරතුරු පාඨමාලාව | අවුරුදු 3 | p.25 |

# විෂය සැකසීම

## A කලාව හා නිර්මාණය
Art & Design

### කලා සහ නිර්මාණ තොරතුරු විද්‍යා වැඩසටහන අවුරුදු 4ක්
★උසස් තාක්ෂණික ඩිප්ලෝමාව
★වෘත්තීය ප්‍රායෝගික විශේෂඥ වැඩසටහන්

කර්මාන්තය මෙහෙයවන කලා අධ්‍යක්ෂ බවට පත්වීම

ඩිජිටල් කලාවේ හැකියාවන් ලුහුබැඳීමට අමතරව, කලා අධ්‍යක්ෂවරයෙක් බවට පත්වීමට දක්ෂ පුද්ගලයෙක් අපි පෝෂණය කරන අතර ඔහුට ව්‍යාපෘතිය සාර්ථකව මෙහෙයවීම සඳහා කළමනාකරණ දක්ෂතා සහ සැලසුම් කිරීමේ හැකියාව ඇත.



ඉලක්ක රැකියාව

| | | |
|---|---|---|
| කලා අධ්‍යක්ෂ | CG නිර්මාණකරු | DTP නිර්මාණකරු |
| වෙබ් නිර්මාණකරු | වෙළඳ දැන්වීම් නිර්මාණකරු | යනාදිය. |
| ක්‍රීඩා CG නිර්මාණකරු | ප්‍රතිරූප නිර්මාණකරු | |

### උසස් කලා සහ නිර්මාණ වැඩසටහන අවුරුදු 3ක් ඩිප්ලෝමාව

නිර්මාණශීලතාව සහ යෝජනා හැකියාව සහිත නිර්මාණකරු හෝ සැලසුම්කරු බවට පත්වීම

නිර්මාණකරුවෙක් සහ සේවාදායකයෙක් අතර පරතරය පුරවන නිෂ්පාදනය සහ උපදේශනය සඳහා ඉහළ දක්ෂතා සහිත සහ උසස් දක්ෂතා සහිත සංකල්ප සැදීමේ හැකියාව සහ ඉදිරිපත් කිරීමේ හැකියාව සහිත දක්ෂ පුද්ගලයෙක් අපි පෝෂණය කරමු.



ඉලක්ක රැකියාව

| | | |
|---|---|---|
| CG නිර්මාණකරු | DTP නිර්මාණකරු | වෙළඳ දැන්වීම් නිර්මාණකරු |
| වෙබ් නිර්මාණකරු | ප්‍රතිරූප නිර්මාණකරු | ක්‍රීඩා CG නිර්මාණකරු යනාදිය. |

විදේශීය සිසුන් සඳහා පමණි | ජාත්‍යන්තර මංගා සහ සජීවිකරණ තාක්ෂණ පාඨමාලාව

### මැන්ගා සහ ඇනිමේ වැඩසටහන අවුරුදු 3ක් ඩිප්ලෝමාව

මැන්ගා සහ ඇනිමේ ඩිජිටල් නිෂ්පාදන දක්ෂතා සහිත කලාශිල්පියෙක්, සජීවිකාරකයෙක් හෝ නිර්මාණකරු බවට පත්වීම

නිෂ්පාදනාගාරය මෙන්ම ප්‍රචාරණ සහ බෙදාහැරීමේ ක්ෂේත්‍රය සඳහා සිසුන් පුහුණු කිරීමට ඇනලොග් මැන්ගා සහ ඇනිමේ නිෂ්පාදන ශිල්ප සහ ඉතිහාසය මත පදනම් වී ඩිජිටල් නිෂ්පාදන මත අපි කටයුතු කරමු.



ඉලක්ක රැකියාව

| | | |
|---|---|---|
| සජීවිකරු | ඩිජිටල් මුද්‍රණකරු | රූපසටහන්කරු |
| මැන්ගා කලා ශිල්පි | CG සජීවිකරු | ප්‍රචාරණ දැන්වීම් නිර්මාණකරු යනාදිය. |

### කලා සහ නිර්මාණ වැඩසටහන අවුරුද 2යි ඩිප්ලෝමාව

ඩිජිටල් කලා කර්මාන්තයට සහයවන නිර්මාණකරුවෙක් හෝ සැලසුම්කරුවෙක් බවට පත්වීම

මෘදුකාංගය මගින් කලාශිල්ප නිර්මාණය කිරීමේ දක්ෂතා සහ වර්ණ සහ කලාව පිළිබඳ මූලික දැනුම සහ කුසලතා සහිත අඛණ්ඩව නිර්මාණාත්මක වැඩ නිෂ්පාදනය කිරීමේ හැකියාව සහිත දක්ෂ පුද්ගලයෙක් අපි පෝෂණය කරමු.

විදේශීය සිසුන් සඳහා පමණි | ජාත්‍යන්තර ICT ව්‍යාපාරික පාඨමාලාව

ඉලක්ක රැකියාව

| | |
|---|---|
| CG නිර්මාණකරු | DTP ක්‍රියාකරු |
| වෙබ් නිර්මාණකරු | අරේකීය සංස්කරණ |
| ක්‍රීඩා CG නිර්මාණකරු | ක්‍රියාකරු යනාදිය. |



## B ව්‍යාපාර සහ කළමනාකරණය
Business & Management

### ව්‍යාපාර සහ කළමනාකරණ තොරතුරු විද්‍යා වැඩසටහන අවුරුදු 4ක්
★උසස් තාක්ෂණික ඩිප්ලෝමාව
★වෘත්තීය ප්‍රායෝගික විශේෂඥ වැඩසටහන්

ප්‍රශස්ථ තොරතුරු පද්ධති යෝජනා කරමින් ව්‍යාපාර මෙහෙයවන උපදේශකයෙක් බවට පත්වීම

නායකයෙක් බවට පත්වීම සඳහා එක් එක් කර්මාන්තයේ මූලික දැනුම සහ ආදායම පිළිබඳ විශ්ලේෂණ ක්‍රමය මෙන්ම එකී තාක්ෂණය භාවිතා කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය ඇතුළුව ව්‍යාපාරික දැනුම සිසුන් ඉගෙන ගනී. නිෂ්පාදන කළමනාකරණය සහ පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය පිළිබඳ දැනුම සහිත දක්ෂ පුද්ගලයෙක් අපි පෝෂණය කරන බැවින් තොරතුරු තාක්ෂණ උපදේශකයෙක් හෝ ව්‍යාපෘති කළමනාකරුවෙක් ලෙස ව්‍යවසායන් තුළ විවිධ අංශ අතර ප්‍රශස්ථ තොරතුරු පද්ධති යෝජනා කිරීමට සහ සැලසුම් කිරීමට ඔවුන්ට හැකි වනු ඇත. KCG විසින් කළමනාකරණ තොරතුරු පාඨමාලාව සහ දත්ත විද්‍යා පාඨමාලාව මාලාව ඉදිරිපත් කරනු ලබයි.



ඉලක්ක රැකියාව

| | | |
|---|---|---|
| තොරතුරු තාක්ෂණ උපදේශක | ඉ-ව්‍යාපාර නිෂ්පාදක | පද්ධති ඉංජිනේරු (SE) |
| තාක්ෂණය සඳහා අලෙවි කාර්ය මණ්ඩලය | දත්ත විද්‍යාඥයා | ව්‍යාපෘති කළමනාකරු යනාදිය. |

### ව්‍යවහාරික තොරතුරු විද්‍යා වැඩසටහන අවුරුදු 3ක් ඩිප්ලෝමාව

පද්ධති ඉංජිනේරුවෙකු වීම සහ කර්මාන්තයේ තොරතුරු තාක්ෂණ විප්ලවයට සහාය වීම සඳහා

මෙම වැඩසටහන මගින් නිර්මාණාත්මක ශිල්පීය ක්‍රම පිළිබඳ උසස් අවබෝධයක් ඇති සහ සේවාදායකයාගේ අවශ්‍යතාවයන්ට සවන් දෙන අතර අදහස් සාකච්ඡා කිරීම හා යෝජනා කිරීම සඳහා සංකල්ප වැඩි දියුණු කිරීමේ හා ඉදිරිපත් කිරීමේ කුසලතා සහිත පුද්ගලයින් සංවර්ධනය කරනු ලබයි. මෙම වැඩසටහනේ පාඨමාලා වනුයේ ජාත්‍යන්තර මෝටර් රථ පාලනය, වෛද්‍ය තොරතුරු, සමුද්‍ර තොරතුරු තාක්ෂණ, කෘෂිකාර්මික තොරතුරු තාක්ෂණ, මූල්‍ය තාක්ෂණය සහ ව්‍යාපාරික තොරතුරු තාක්ෂණ වේ.

විදේශීය සිසුන් සඳහා පමණි | ජාත්‍යන්තර මෝටර් රථ පාලන පාඨමාලාව<br>ජාත්‍යන්තර ව්‍යාපාර කළමනාකරණ පාඨමාලාව

ඉලක්ක රැකියාව

- වාහන ඉංජිනේරු
- සමුද්‍ර / ජලජ ජීවී ඉංජිනේරු
- කෘෂිකර්ම / වන විද්‍යා ඉංජිනේරු
- මූල්‍ය ඉංජිනේරු
- වෛද්‍ය තොරතුරු තාක්ෂණ ශිල්පී යනාදිය.

### තොරතුරු ව්‍යාපාරික වැඩසටහන අවුරුද 2යි ඩිප්ලෝමාව

පරිගණක දක්ෂතා සහ මනාව පුහුණු ව්‍යාපාරික රටා සහිත සාර්ථක ව්‍යාපාරිකයෙක් බවට පත්වීම

සිසුන් Microsoft Word, Excel සහ Access මෙන්ම ගිණුම්කරණය, ව්‍යාපාරික රටාව, සහ සන්නිවේදන දක්ෂතා වැනි කාර්යාල මෙවලම් පිළිබඳව ඉගෙන ගනී. මූලික ව්‍යාපාරික දැනුම සහිත සාර්ථක ව්‍යාපාරිකයෙක් බවට පත්වන සිසුන් අපි පෝෂණය කරමු. ඔවුන් ඕනෑම අවස්ථාවක සක්‍රිය කාර්යභාරයක් ඉටු කරයි.

ඉලක්ක රැකියාව

- පද්ධති පරිපාලක
- විකුණුම් සහ අලෙවිකරණ කාර්ය මණ්ඩලය
- පරිගණක ක්‍රියාකරු සඳහා උපදේශක
- පරිපාලන සහ ගිණුම්කරණ කාර්ය මණ්ඩලය යනාදිය.

### තොරතුරු තාක්ෂණ වෛද්‍ය පරිපාලන වැඩසටහන අවුරුද 2යි ඩිප්ලෝමාව

වෛද්‍ය හා පරිගණක ක්ෂේත්‍රවල දැනුම ලබා ගැනීම මගින් අනාගතයේ වෛද්‍ය සේවා ස්ථාන පරිගණකගත කිරීම මෙහෙයවිය හැකි විශේෂඥයකු බවට පත්වන්න

පරිගණක ආශ්‍රිත දැනුම වර්තමානයේ වෛද්‍ය සේවා ස්ථාන තුළ අතිශයින් වැදගත් වන නමුත්, මෙම අවශ්‍යතාවට ප්‍රතිචාර දැක්විය හැකි පුද්ලයින්ගේ සැපයුම අඩුයි. වෛද්‍ය කාර්යාල පරිපාලන වැඩසටහනේ දී සිසුන් වෛද්‍ය දැනුම හා තොරතුරු තාක්ෂණ කුසලතාවයන් අත්කර ගනිමින් අනාගතයේ වෛද්‍ය සේවා ස්ථාන පරිගණකගත කිරීම මෙහෙයවිය හැකි විශේෂඥයන් බවට පත්වෙයි.

ඉලක්ක රැකියාව

රෝහල්, සායන ආදියෙහි වෛද්‍ය පරිපාලනය.

# C පරිගණක විද්‍යාව
## Computer Science

## පරිගණක විද්‍යා වැඩසටහන　අවුරුදු 4ක්
★උසස් තාක්ෂණික ඩිප්ලෝමාව
★වෘත්තීය ප්‍රායෝගික විශේෂඥ වැඩසටහන්

### කර්මාන්තය ඉදිරියට ගෙනයාමේ විශේෂඥයෙක් බවට පත්වීම

විසඳුම් ඉංජිනේරුවරයෙක් හෝ තොරතුරු තාක්ෂණ ශිල්පියෙක් ලෙස තොරතුරු පද්ධති මගින් පාරිභෝගික අවශ්‍යතා විශ්ලේෂණය කළ හැකි සහ විසඳුම් යෝජනා කළහැකි සිසුන් අපි පෝෂණය කරමු.



**ඉලක්ක රැකියාව**

| | | |
|---|---|---|
| විසඳුම් ඉංජිනේරු | පද්ධති ඉංජිනේරු (SE) | තොරතුරු තාක්ෂණ ශිල්පි |
| ව්‍යාපෘති කළමනාකරු | ජාල ඉංජිනේරු | යනාදිය. |

## මල්ටිමීඩියා පරිගණක වැඩසටහන　අවුරුදු 3ක්　ඩිප්ලෝමාව

### මෘදුකාංග සංවර්ධනය මෙහෙයවන නායකයෙක් බවට පත්වීම

මෙම වැඩසටහන මගින් අපි අන්තර්ක්‍රියාකාරීව වීඩියෝ, ශ්‍රව්‍ය සහ අනෙකුත් අන්තර්ගත යැවීමට සහ ලබා ගැනීමට හැකි සන්නිවේදන පද්ධති සැලසුම් කිරීමට, නිර්මාණය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති දක්ෂ ඉංජිනේරුවන් නිර්මාණය කරන්නෙමු.

**ඉලක්ක රැකියාව**

| | | |
|---|---|---|
| පද්ධති ඉංජිනේරු (SE) | දත්තපදනම් ඉංජිනේරු | වෙබ් ඉංජිනේරු |
| වැඩසටහන්කරු | CG ඉංජිනේරු | යනාදිය. |

## පරිගණක ජාලකරණ වැඩසටහන　අවුරුදු 3ක්　ඩිප්ලෝමාව

### පද්ධති ගොඩනැගිය හැකි ඉංජිනේරුවෙක් බවට පත්වීම

තොරතුරු ආරක්ෂාව, පරිගණක ජාලගතකරණය සහ දත්ත පදනම පිළිබඳව දැනුවත් සහ ස්ථිර තොරතුරු පද්ධති ගොඩනැගිය හැකි ඉංජිනේරුවෙක් බවට පත්වන දක්ෂ පුද්ගලයින් අපි පෝෂණය කරමු.



**ඉලක්ක රැකියාව**

| | | |
|---|---|---|
| ජාලගතකරණය ඉංජිනේරු | දත්තපදනම් ඉංජිනේරු | පද්ධති ඉංජිනේරු (SE) |
| ජාලකරණ පරිපාලක | ආරක්ෂක ඉංජිනේරු | යනාදිය. |

## තොරතුරු පිරිසැකසුම් වැඩසටහන　අවුරුද 2යි　ඩිප්ලෝමාව

### ක්‍රමලේඛන ශිල්පයේ සහ තොරතුරු තාක්ෂණයේ මූලික කරුණු ප්‍රගුණ කළ කාර්මික ශිල්පියෙකු වීම

මෙම වැඩසටහන මගින් පරිගණක,ජාල සහ තොරතුරු න්‍යාය පිළිබඳ මූලික පුහුණුවක් ඇති ක්‍රමලේඛකයින්,පද්ධති ඉංජිනේරුවන් සහ පද්ධති ක්‍රියාකරුවන් සංවර්ධනය කරනු ලබයි. මෙම වැඩසටහනේ පාඨමාලා වන්නේ ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණය,තොරතුරු පිරිසැකසුම් සහ තොරතුරු තාක්ෂණ හඬ නිරූපනයයි.

**විදේශීය සිසුන් සඳහා පමණි** | ජාත්‍යන්තර ව්‍යාපාරික තොරතුරු තාක්ෂණ පාඨමාලාව



**ඉලක්ක රැකියාව**

| | | |
|---|---|---|
| වැඩසටහන්කරු | පද්ධති ඉංජිනේරු (SE) | යෙදුම් ක්‍රියාකරු |
| වෙබ් වැඩසටහන්කරු | හඬ නිරූපණය | විස්තර කථක　යනාදිය. |



# D ඩිජිටල් ක්‍රීඩා සහ විනෝදාත්මක ක්‍රියා
## Digital Game & Amusement

## උසස් ඩිජිටල් ක්‍රීඩා සහ විනෝදාත්මක ක්‍රියා වැඩසටහන　අවුරුදු 4ක්
★උසස් තාක්ෂණික ඩිප්ලෝමාව
★වෘත්තීය ප්‍රායෝගික විශේෂඥ වැඩසටහන්

### ඊළඟ පරම්පරාව තුළ ක්‍රීඩා නිෂ්පාදනයේ නායකයෙක් බවට පත්වීම

නායකත්වය සහ වැඩසටහන්කරණය සහ තාක්ෂණික කුසලතා සහිත නිෂ්පාදන කණ්ඩායම මෙහෙයවන සාමාන්‍ය අධ්‍යක්ෂවරයෙක් හෝ තාක්ෂණික අධ්‍යක්ෂවරයෙක් බවට පත්වන දක්ෂ පුද්ගලයින් අපි පෝෂණය කරමු.



**ඉලක්ක රැකියාව**

| | |
|---|---|
| ක්‍රීඩා අධ්‍යක්ෂ | තාක්ෂණික අධ්‍යක්ෂ |
| ක්‍රීඩා නිෂ්පාදක | ක්‍රීඩා වැඩසටහන්කරු |
| ක්‍රීඩා සැලසුම්කරු | ක්‍රීඩා CG නිර්මාණකරු　යනාදිය. |

## උසස් ඩිජිටල් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන　අවුරුදු 3ක්　ඩිප්ලෝමාව

### තියුණු දක්ෂතා සහිත ක්‍රීඩා නිර්මාණකරුවෙක් බවට පත්වීම

ඉහළ මට්ටමේ දක්ෂතා සහිත 3D ක්‍රීඩා සහ මාර්ගගත ක්‍රීඩා නිර්මාණය කරන ක්‍රීඩා වැඩසටහන්කරුවෙක් බවට පත්වන දක්ෂ පුද්ගලයෙක් හෝ ක්‍රීඩාකරුවන්ට විනෝද වියහැකි පුළුල් දෘෂ්ටිකෝණයකින් ක්‍රීඩා නිර්මාණය කරන ක්‍රීඩා සැලසුම්කරුවෙක් බවට පත්වන පුද්ගලයා අපි පෝෂණය කරමු.



**ඉලක්ක රැකියාව**

| | |
|---|---|
| ක්‍රීඩා වැඩසටහන්කරු | ක්‍රීඩා සැලසුම්කරු |
| ක්‍රීඩා කොටස් ලේඛක | ක්‍රීඩා CG නිර්මාණකරු　යනාදිය. |

## ඩිජිටල් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන　අවුරුද 2යි　ඩිප්ලෝමාව

### ක්‍රීඩා සංවර්ධනය පිළිබඳව ස්ථාවර දැනුම සහිත නිර්මාණකරුවෙක් බවට පත්වීම

සිසුන් C++ භාෂාව, ග්‍රැපික් නිර්මාණ, ක්‍රීඩා කොටස් සහ නියමයන් සැලසුම් කිරීම පිළිබඳව ඉගෙන ගනී. ක්‍රීඩා සැලසුම්කරුවෙක්, ක්‍රීඩා වැඩසටහන්කරුවෙක් හෝ සංවර්ධන සහයකයෙක් ලෙස අධ්‍යක්ෂ සුපරීක්ෂණය සහිත සක්‍රීය කාර්යභාරය ඉටුකරන දක්ෂ පුද්ගලයා අපි පෝෂණය කරමු.



**ඉලක්ක රැකියාව**

| | |
|---|---|
| ක්‍රීඩා වැඩසටහන්කරු | ක්‍රීඩා සැලසුම්කරු |
| ක්‍රීඩා කොටස් ලේඛක | ක්‍රීඩා CG නිර්මාණකරු |
| ක්‍රීඩා සංවර්ධන සහයක　යනාදිය. | |

# E එම්බෙඩැඩ් පද්ධති සඳහා ඉංජිනේරු විද්‍යාව
Engineering for Embedded Systems

## තොරතුරු ඉංජිනේරු වැඩසටහන — අවුරුදු 4ක්
★උසස් තාක්ෂණික ඩිප්ලෝමාව
★වෘත්තීය ප්‍රායෝගික විශේෂඥ වැඩසටහන්

### එම්බෙඩැඩ් පද්ධති පිළිබඳ ප්‍රවීනයෙන් බවට පත්වීම

සිසුන් දෘඩාංග සහ මෘදුකාංග පිළිබඳව පමණක් නොව එම්බෙඩැඩ් පද්ධති පිළිබඳ උපදේශනය, නිර්මාණය, සංවර්ධනය, නඩත්තුව සහ පරිපාලනය පිළිබඳව ඉගෙන ගනී. එකි පුළුල් දැනුම සමඟ, ඔවුන්ට සංවර්ධන කණ්ඩායමක් තුළ ව්‍යාපෘති කළමනාකරුවෙක් හෝ තොරතුරු තාක්ෂණ ශිල්පියෙක් බවට පත්විය හැකිය.



**විදේශීය සිසුන් සඳහා පමණි**
ජාත්‍යන්තර තොරතුරු විද්‍යා පාඨමාලාව
ජාත්‍යන්තර කලා තොරතුරු පාඨමාලාව　ජාත්‍යන්තර කළමනාකරණ තොරතුරු විද්‍යා පාඨමාලාව

**ඉලක්ක රැකියාව**

| | | |
|---|---|---|
| තොරතුරු තාක්ෂණ ශිල්පි | ඇතුළත් කළ පද්ධති ඉංජිනේරු | දෘඩාංග සංවර්ධක |
| මෙකාට්රෝනික්ස් ඉංජිනේරු | පද්ධති ඉංජිනේරු (SE) | යනාදිය. |

## උසස් පරිගණක ඉංජිනේරු වැඩසටහන — අවුරුදු 3ක් — ඩිප්ලෝමාව

### කාවැද්දූ තාක්‍ෂණයෙන් නිෂ්පාදන සංවර්ධනය දියුණු කළ හැකි ඉංජිනේරුවෙකු වීම

රොබෝවරු නිර්මාණය කිරීම, සන්නිවේදන උපකරණ,මෝටර් රථ ඉංජිනේරු විද්‍යාව සහ ක්ෂුද්‍ර සකසන පාලනයන් ආදී දෑ පුහුණු වීම තුළින් සිසුන් කාවැද්දූ පද්ධති පිළිබඳ පරිපූර්ණ අධ්‍යයනයක නිරත වේ. නිෂ්පාදන සංවර්ධනයේ ඉදිරි පෙළේ කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කල හැකි පද්ධති ඉංජිනේරුවන්, ක්‍රමලේඛකයින් සහ මෙකාට්‍රොනික්ස් ඉංජිනේරුවන් බවට මෙම වැඩසටහනේ උපාධිධාරීන් පත් වේ. මෙම වැඩසටහනේ පාඨමාලා ලෙස ජාත්‍යන්තර තොරතුරු,පරිගණක ඉංජිනේරු සහ මෝටර් රථ පාලනය දැක්විය හැකිය.



**විදේශීය සිසුන් සඳහා පමණි**
ජාත්‍යන්තර තොරතුරු පාඨමාලාව
ජාත්‍යන්තර කලා හා නිර්මාණ පාඨමාලාව　ගෝලීය සංචාරක උසස් තොරතුරු පාඨමාලාව

**ඉලක්ක රැකියාව**

| | | | |
|---|---|---|---|
| ඇතුළත් කළ පද්ධති ඉංජිනේරු | පද්ධති ඉංජිනේරු (SE) | පාලන ක්‍රමලේඛක | ගුවන් යානා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු |
| මෙකාට්රෝනික්ස් ඉංජිනේරු | පාරිභෝගික ඉංජිනේරු | ECU සංවර්ධක | යනාදිය. |

## පරිගණක ඉංජිනේරු විද්‍යා වැඩසටහන — අවුරුද 2යි — ඩිප්ලෝමාව

### දෘඩාංග සහ මෘදුකාංගවල පදනම් ඉගෙනීම මඟින් පාලන පද්ධති ඉංජිනේරුවරයෙක් බවට පත්වීම

ඒකාබද්ධ පද්ධති සංවර්ධනය තුළ විශේෂඥයෙක් බවට පත්වීමට අවශ්‍යවන දෘඩාංග සහ මෘදුකාංග සඳහා මූලික දැනුම සහ කුසලතා සිසුන් ඉගෙන ගන්නා අතර, සංවර්ධනය තුළ නායකයින් වෙත මනා සේවාවක් ලබාදීම සඳහා හැකියාව සහිත පාලන පද්ධති ඉංජිනේරුවරයෙක් බවට පත්වීමට ඔවුන් පුහුණු කරනු ලැබේ.

**විදේශීය සිසුන් සඳහා පමණි**
ගෝලීය සංචාරක තොරතුරු පාඨමාලාව

**ඉලක්ක රැකියාව**

| | |
|---|---|
| ඇතුළත් කළ පද්ධති ඉංජිනේරු | පාරිභෝගික ඉංජිනේරු |
| පද්ධති ඉංජිනේරු (SE) | යනාදිය. |
| පාලන වැඩසටහන්කරු | |

# තොරතුරු සහ සන්නිවේදනය
Information & Communication

## තොරතුරු සහ සන්නිවේදන පාඨමාලාව — අවුරුදු 1ක / අවුරුදු 2ක රාත්‍රී පාඨමාලාව



මෙය කෙටි කාලයක් තුළ තොරතුරු තාක්ෂණ කුසලතා ඉගෙනීමට අවශ්‍ය පුද්ගලයින් සඳහා පාඨමාලාවකි. ඔබගේ අවශ්‍යතාව සඳහා සුදුසු පන්ති තෝරාගන්න. ඔබට වැඩසටහන්කරණය, පද්ධති සංවර්ධනය, තොරතුරු පද්ධතිය ඉගෙන ගත හැකිය නැතිනම් ඔබගේ අරමුණ මත රැඳෙමින් යෙදුම් සුදුසුකම අධ්‍යයනය කළ හැකිය.





# KCG ජාත්‍යන්තර සිසුන් සඳහා විශේෂ පාඨමාලා
## සිසුන් හට අප්‍රේල් හෝ ඔක්තෝබර් මාසවල දී ඇතුළත් විය හැක

ලොව පුරා ක්‍රියාකාරී භූමිකාවන් ඉටු කළ හැකි තොරතුරු තාක්ෂණ ඉංජිනේරුවන් බිහි කිරීමේ අරමුණ ඇතිව KCG විසින් ජාත්‍යන්තර සිසුන්ගේ අවශ්‍යතා සඳහා විශේෂ පාඨමාලා ස්ථාපිත කර ඇත. සිසුන්ට අප්‍රේල් හෝ ඔක්තෝබර් මාසවල දී ඒවාට ලියාපදිංචි විය හැක.

KCG ජාත්‍යන්තර සිසුන්ගේ කටයුතු සඳහා වගකිව යුතු බොහෝ කාර්ය මණ්ඩල සාමාජිකයින් යොදවනු ලබයි. මෙම කාර්ය මණ්ඩලය සිසුන්ට අධ්‍යයන කටයුතුවල සිට සරසවි ජීවිතය දක්වාත්, අර්ධකාලීන රැකියා සොයා ගැනීම දක්වාත් කටයුතුවලට සහාය වේ. ඔවුන් දරන මහත් වෙහෙසට ස්තූති වන්නට, ලොව පුරා රටවලින් KCG හා සම්බන්ධ වන ජාත්‍යන්තර සිසුන් බොහෝ ගණනකට ඵලදායී ශිෂ්‍ය දිවියක් ගත කළ හැක.

## *ජපානයේ හෝ ඔබේ මව් රටේ විශිෂ්ට වෘත්තීය ගමන් මාර්ග සොයා ගන්න!*

## ජාත්‍යන්තර ICT ව්‍යාපාරික පාඨමාලාව
කලා සහ නිර්මාණ වැඩසටහන　අවුරුදු 2ක්
ඩිප්ලෝමාව　කමෝගාවා සරසවිය

මෙම පාඨමාලාවේදී, සිසුන් ප්‍රථමයෙන් ව්‍යාපාරයේ නව යුගයේ අත්‍යවශ්‍ය වන ICT පිළිබඳ මූලික දැනුම ඉගෙන ගනු ඇත, සහ ව්‍යාපාරයේ සමාජ ජාල සේවා (SNS) භාවිතා කිරීම සඳහා “තොරතුරු රැස් කිරීම, තොරතුරු විශ්ලේෂණය, තොරතුරු සම්ප්‍රේෂණය සහ සම්බන්ධතා ගොඩනැගීම” ඉගෙන ගනු ඇත. මෙන්ම ICT ක්ෂේත්‍රයේ නවීන කුසලතා. ශීඝ්‍රයෙන් වෙනස් වන සමාජයක සමෘද්ධිමත් වෙමින් ව්‍යාපාරික භාවිතය සඳහා SNS සම්පූර්ණයෙන්ම භාවිතා කළ හැකි ගෝලීය වෘත්තිකයන් වීමට මෙම පාඨමාලාව සිසුන් පුහුණු කරනු ඇත. පාඨමාලාවේ උපාධිධාරීන්ට “ඩිප්ලෝමාව” යන මාතෘකාව පිරිනමනු ලැබේ, ඔවුන්ගේ මව් රටවල හෝ ජපානයේ වෘත්තීය වෘත්තීන් හැදෑරීමට ඔවුන්ට හැකි වේ.



**1 වන වසර**
පළමු වසර තුළ, ඔබ ඔබේ ව්‍යාපාර ආශ්‍රිත ජපන් භාෂා කුසලතා ශක්තිමත් කරන අතර ICT සහ ව්‍යාපාර පිළිබඳ මූලික කරුණු ඉගෙන ගනු ඇත. පාඨමාලා Microsoft Office, පරිගණක මූලික කරුණු, ඉදිරිපත් කිරීමේ කුසලතා සහ “තාක්ෂණික ජපන්” වැනි ජපන් භාෂා විෂයයන් ආවරණය කරනු ඇත, එහිදී ඔබ ලිවීමේ සහ සන්නිවේදන කුසලතා වර්ධනය කරනු ඇත.

**2 වන වසර**
සිසුන් තම කුසලතා සහ දැනුම තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා ව්‍යාපාර සහ ICT සම්බන්ධ පුළුල් පරාසයක විෂයයන්ගෙන් තමන් කැමති විෂයයන් තෝරා ගනී. සිසුන් සමාජ මාධ්‍ය පිළිබඳ මූලික දැනුම සහ X (කලින් Twitter) සහ Facebook වැනි විවිධ SNS සඳහා අන්තර්ගතයන් නිර්මාණය කිරීමට අවශ්‍ය අන්තර්ගතය ඉගෙන ගනු ඇති අතර, ඔවුන් තම සමාගම් ගෝලීයකරණය කිරීමට හැකි වන පරිදි ව්‍යාපාර සැලසුම් කුසලතා ද වර්ධනය කරනු ඇත.





**වෘත්තීය අවස්ථා**

| | |
|---|---|
| වෙබ් (SNS) අලෙවිකරණය | වෙබ් (SNS) අධ්‍යක්ෂ |
| වෙබ් සැලසුම් සහ මහජන සම්බන්ධතා | SNS මෙහෙයුම් කළමනාකරු |
| SNS උපදේශක | සාමාන්‍ය පරිපාලන කටයුතු (පොදු කටයුතු, මානව සම්පත්, ගිණුම්කරණය, විකුණුම් පරිපාලනය, ආදිය) |

**සුදුසුකම් විභාගයට සූදානම් වීම**

| | |
|---|---|
| Illustrator® නිර්මාපක ප්‍රවීණතා පරීක්ෂණය | Photoshop® නිර්මාපක ප්‍රවීණතා පරීක්ෂණය |
| SNS අලෙවිකරණ ප්‍රවීණතා පරීක්ෂණය | |

## ජාත්‍යන්තර මෝටර් රථ පාලන පාඨමාලාව

ව්‍යවහාරික තොරතුරු විද්‍යා වැඩසටහන　අවුරුදු 3ක්
ඩිප්ලෝමාව　කියෝතෝ එකිමඑ සරසවිය

ජපානයේ හෝ ඔබේ මව් රටේ විශිෂ්ට වෘත්තීය ගමන් මාර්ග සොයා ගන්න!

ඩිජිටල් ප්‍රවාහන කටයුතු සහිත සමාජයක් සහ හරිත පරිණාමනයක් සාක්ෂාත් කර ගැනීම අරමුණු කරගනිමින්, නවීන තාක්‍ෂණය උපයෝගී කොටගත් ජංගම සේවා මහජනතාවට ලබා ගත හැක. මෙම පාඨමාලාවේ දී, KCG අනාගතයේ මෝටර් රථ කර්මාන්තයට නායකත්වය දිය හැකි රථ වාහන ඉංජිනේරුවන් බිහි කිරීම හරහා නව සමාජ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමට අරමුණු කරයි. පාඨමාලාවේ උපාධිධාරීන්ට "ඩිප්ලෝමාව" යන මාතෘකාව පිරිනමනු ලැබේ, ඔවුන්ගේ මව් රටවල හෝ ජපානයේ වෘත්තීයමය වශයෙන් වැඩ කිරීමට හෝ KCG හි සමූහ පාසල කියෝතෝ තොරතුරු විද්‍යා උපාධි අධ්‍යයන විද්‍යාලය (KCGI) වෙත ඇතුළත් වී ශාස්ත්‍රපති උපාධියක් හැදෑරීමට හැකි වේ.






**1 වන වසර**
